වාර්ෂික වාර්තාව - 2022

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කර ගත් පුරෝගාමී ආයතනයක් වීම.

මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

සභාපතිතුමියගේ පණිවිඩය

වර්ෂ 1969 දී ආරම්භ කළ රාජ්‍ය සංස්ථාවක් වන ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මේ වන විට වසර 53ක දිර්ඝ ඉතිහාසයක් පවතී. වසර ගණනාවක් අඛණ්ඩව ලාභ ලබමින් පැවති මෙම සංස්ථාව 2020 වසර මුල සිට පැවති Covid වසංගත තත්ත්වය සහ අනෙකුත් පාලනය කළ නොහැකි සාධක මත පසුගිය වසරෙහි මෙන්ම මෙම වර්ෂයේ ද අලාභ ලබන තත්ත්වයට පත්ව ඇත. අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ පිරිවැය ඉහළ අගයක් ගැනීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාම මීට ප්‍රධානතම හේතුව වී ඇත.



සංස්ථාව සෘජුව ආනයනය කරනු ලබන අමුද්‍රව්‍ය සහ දේශීය සැපයුම්කරුවන් මඟින් ලබාගන්නා ආනයනික අමුද්‍රව්‍ය, ඩොලරයේ සීග්‍ර ඉහළ යාමත් සමඟ දේශීය අමුද්‍රව්‍ය සැපයුම් මිල ද සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. මෙම අධික පිරිවැය ආවරණය කර ගැනීම සඳහා අකමැත්තෙන් වුවද සංස්ථාවේ නිෂ්පාදන වල මිල වසර කිහිපයකට පසුව ඉහළ දැමීමට සිදුවිය.

සංස්ථාව මඟින් පවත්වාගෙන යනු ලබන අලෙවි මධ්‍යස්ථාන 17ක් මඟින් දිවයින පුරා සිටින පාරිභෝගිකයන් වෙත සැපයීම ප්‍රමාණවත් තරම් සිදුකල නොහැකි බැවින් එහි පවතින අඩුපාඩු මහහරවා ගැනීමට ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් පත් කර ගැනීමට 2022 වර්ෂයේදී අප කටයුතු කරන ලදී. මේ තුළින් සංස්ථාවේ නිෂ්පාදන තවදුරටත් ප්‍රවලිත කිරීමට අපේක්ෂා කරයි.

අමාත්‍යාංශ ලේකම්තුමියගේ මැදිහත් වීම මත වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන ලබාගෙන නිකවැරටිය ඔසු උයනෙහි වැව ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමට ලැබීමත්, ඒ තුළින් වසර ගණනාවක සිට එහි පැවති ජල ගැටළුව විසඳා ගැනීමට අපට හැකි විය.

පසුගිය වර්ෂ කීහිපයෙහි පැවති අලාභ ආවරණය කර ගනිමින් ලාභ ලැබීමත්, ආයතනයේ කටයුතු පුළුල් කිරීම සඳහා සංස්ථාවට මෙන්ම දේශීය නිෂ්පාදකයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය එක් රැස් කිරීමේ මධ්‍ය ගබඩාවක් ස්ථාපිත කිරීම තුළින් අමුද්‍රව්‍ය සම්පාදනය කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මඟින් සිදු කිරීම 2023 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

දුෂ්කරතා රාශියක් මධ්‍යයේ වුවද, 2022 වර්ෂය සාර්ථක කර ගැනීම සඳහා මා හට අවශ්‍ය සහය ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සංස්ථාවේ සියලුම කාර්යය මණ්ඩලය සඳහා ස්තුතිය මේ සමඟ පළ කරමි.

නීතිඥ සාගලා අභයවික්‍රම
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

අධ්‍යක්ෂවරු

නීතීඥ සාගලා අභයවික්‍රම මහත්මිය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති වශයෙන් සාගලා අභයවික්‍රම මහත්මිය 2019.12.27 දින සිට කටයුතු කරන අතර වසර 50ක සංස්ථා ඉතිහාසයේ ප්‍රථම සභාපතිනිය වේ. ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් පිටවූ පසුව වෘත්තිය නීතිඥවරියක වශයෙන් වසර 19ක පමණ සේවා පළපුරුදක් ලබා ඇත. එමෙන්ම DFCC Bank ආයතනයේ නීති නිලධාරිනියක වශයෙන්ද, ශ්‍රී ලංකා කාන්තා නීතීඥ සංගමයේ උප සභාපතිනිය වශයෙන්ද කටයුතු කර ඇත.

ශාන්ත ලියනගේ මහතා

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ කළමණාකාර අධ්‍යක්ෂ වශයෙන් ශාන්ත ලියනගේ මහතා 2020.01.17 දින සිට කටයුතු කරනු ලබයි. සමුපකාර කළමනාකරණ පුහුණු ආයතනය මඟින් ග්‍රාමීය බැංකු ඩිප්ලෝමාව ලබා ඇති අතර ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු ආයතන ගණනාවක පාඨමාලා සඳහා සහභාගී වී ඇත. මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 24 ඉක්ම වූ සේවා කාලය තුල දී Seeds Guarantee LTD ආයතනයේ සහකාර කළමණාකරු/ දිස්ත්‍රික් ව්‍යාපෘති කළමණාකරු ලෙස ද, සර්වෝදය සංවර්ධන මූල්‍ය සමාගමේ කළාපිය කළමණාකරු සහ ජ්‍යෙෂ්ඨ කළමණාකරු යන තනතුරු වල සේවය කර ඇත. එමෙන්ම සබරගමුව පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද වර්තමානයේ කටයුතු කරනු ලබයි.

ගීතාමනි සී කරුණාරත්න මහත්මිය

සහකාර ප්‍රාදේශිය ලේකම්වරියක වශයෙන් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවයට සම්බන්ධවී ඇති විශේෂ ශ්‍රේණියේ නිලධාරිනියකි. ප්‍රථම උපාධිය රුහුණු විශ්වවිද්‍යාලයේ වාණිජ පීඨය මඟින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන්ද ලබාගෙන ඇත. වසර 29ක සේවා කාලය තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන රැසක සේවය කර ඇත. දැනට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වශයෙන් සේවය කරනු ලබයි.

චන්ද්‍රිකා සේනානායක මහත්මිය

2002 වර්ෂයේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය ආරම්භ කර ඇත. එහි වසර 7කට ආසන්න කාලයක් සේවය කර 2008-2010 කාලය තුළ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂිකාවක් ලෙස සිය රාජකාරී කටයුතු සිදු කර ඇත. පසු කාලීනව 2010-2012 වර්ෂයේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක් ලෙස ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේද, එම දෙපාර්තමේන්තුවේම 2012-2021 කාලය තුළ අධ්‍යක්ෂකවරියක් වශයෙන්ද සේවය කර ඇති චන්ද්‍රිකා සේනානායක මහත්මිය 2021 වර්ෂයේ සිට මේ දක්වා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරියක් වශයෙන් කටයුතු කරනු ලබයි.

ප්‍රථම උපාධිය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය මඟින් ද, සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොළඹ විශ්ව විද්‍යාලය මඟින් ද, මූල්‍ය ආර්ථික විද්‍යාව පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලය මඟින්ද ලබා ඇත.

බන්දුලසේන ඩයස් දහනායක මහතා

1980 වර්ෂයේ උප දිසාපතිවරයෙක් වශයෙන් රජකාරී ආරම්භ කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කිහිපයක සේවය කිරීමෙන් පසු 2012 වර්ෂයේදී දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් ලෙස කටයුතු කර විශ්‍රාම ලබා ඇත. ප්‍රථම උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය මඟින්ද, රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ද ලබා ගෙන ඇත. එමෙන්ම කොළඹ විශ්වවිද්‍යාලය මඟින් බලය බෙදීම සහ පළාත් පාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ගෙන ඇත.

ප්‍රදීප් ඒ. පිරිස් මහතා

Asia e University – Malaysia ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇති අතර ආචාර්ය උපාධිය ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවති. භාණ්ඩ ප්‍රවාහනය, නැවිගත කිරීම සහ ගබඩාකරණය පිළිබඳව වසර 33ක පළපුරුද්දක් ලබා ඇත. Colombo Logistic සමූහ ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂක/ සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරන අතර The Lions Sightfirst Eye Hospital ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සේවය කරනු ලබයි.

එස්.කේ.ඩබ්.ජී. ගුරුසිංහ මහතා

කොළඹ විශ්වවිද්‍යාලයිය දේශීය වෛද්‍ය විද්‍යායතනයේ ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී (B.A.M.S) උපාධිය ලබා ඇත. අනතුරුව වෛද්‍ය සේවයට පිවිස Aitken Spence සමාගමට අයත් මාලදිවයිනේ මීදුප්පාරු සංචාරක හෝටලයේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ ආයුර්වේද වෛද්‍යවරයා ලෙස කටයුතු කළේය. පසුව එම සමාගමටම අයත් නෙප්චුන් ආයුර්වේද හෝටලයේ ආයුර්වේද වෛද්‍යවරයෙකු ලෙස සේවය කර, රජයේ සේවයට එක්ව රත්නපුර ආයුර්වේද රෝහල, ඇහැළියගොඩ හා කරදන ප්‍රදේශ වල ආයුර්වේද බෙහෙත් ශාලා වල සේවය කළේය. දැනට මහරගම නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී ලෙස සේවය කරයි. මේ වන විට යක්කල වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ කාය චිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව අවසන් කරමින් සිටී. හෙතෙම බද්දේගම ප්‍රදේශය ආශ්‍රීත දිවිතුරේ වෙද පරපුරට අයත්ය.

පටුන

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	-	01 - 19
ආයතනික පාලන වාර්තාව	-	20 - 21
විගණකාධිපති වාර්තාව	-	22 - 44
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	-	45
ආදායම් ප්‍රකාශය	-	46 - 47
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	-	48
ස්කන්ධ ප්‍රග්ධනය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය	-	49
ගිණුම්කරණ ප්‍රතිපත්ති	-	50 - 59
ගිණුම් පිළිබඳ සටහන්	-	60 - 75
පසුගිය වසර 10ක වැදගත් මූල්‍ය විස්තර	-	76

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2022 වර්ෂය

01. හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් සංස්ථාව පිහිටුවා ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2022.12.31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව පහත ඉදිරිපත් කරමි.

02. ප්‍රධාන අරමුණු

1. ආයුර්වේද ඖෂධ වර්ග හෙසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.
2. අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.
3. දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.
4. ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ හෙසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.
5. ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.
6. ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළහිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.
7. ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

03. ආයතනික තොරතුරු

3.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න දරණ ස්ථානයේ පිහිටා ඇත.

3.2 අලෙවි මධ්‍යස්ථාන

නාවින්න	: අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම.
විජේරාම (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ.
මහනුවර (වෛද්‍ය සායනයද සමඟ)	: අංක 70, යටිනුවර වීදිය, මහනුවර.
දියතලාව	: සනානි මන්දිරය, දියතලාව.
අනුරාධපුරය	: උතුරු මැද ප්‍රාදේශීය කාර්යාලය, ක්‍රීඩාංගණ මාවත, බැංකු පෙදෙස, අනුරාධපුරය.
බදුල්ල	: බී 35-36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල.
කොටුව	: 2 වන වේදිකාව,කොටුව දුම්රිය ස්ථානය, කොටුව.
රත්නපුර	: අංක 32, බස්නැවතුම් පොළ පාර, රත්නපුර.
මාතර	: අංක 43, පරණ තංගල්ල පාර, කොටුවේගොඩ, මාතර.
යාපනය	: අංක 169, කේ.කේ.එස් පාර, යාපනය.
ගාල්ල	: අංක 38 , ඕල්කට් මාවත,ගාල්ල.
මොණරාගල	: අංක 267, වැල්ලවාය පාර, මොණරාගල.
බොරැල්ල	: ආයුර්වේද ජාතික ශික්ෂණ රෝහල, ආචාර්ය එන්.එම්.පෙරේරා මාවත, බොරැල්ල.
ජා ඇල	: අංක 18, කපුවත්ත, ජා ඇළ.
බෙරුවල	: අංක 149/B, සමුපකාර මන්දිරය, බෙරුවල.
නාරහේන්පිට	: රජවාස, විශේෂ ආර්ථික මධ්‍යස්ථානය, කිරිමණ්ඩල පාර, නාරහේන්පිට.
ඇඹිලිපිටිය	: අංක 87, මොරකැටිය පාර, ඇඹිලිපිටිය.
කිරිබත්ගොඩ	: අංක 06, ජාතික නිවාස යෝජනා ක්‍රමය කිරිබත්ගොඩ.

3.3 විගණකවරු

විගණකාධිපති, අංක: 306/72, පොල්දූවපාර, බත්තරමුල්ල.

3.4 බැංකු

මහජන බැංකුව සහ ලංකා බැංකුව

04. අධ්‍යක්ෂ මණ්ඩලය

1.	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය	-	සභාපති
2.	එල්.ආර්.ඩී. ශාන්ත කුමාර මහතා	-	කළමනාකාර අධ්‍යක්ෂ
3.	ගීතාමනි සි. කරුණාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4.	චන්ද්‍රිකා සේනාරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5.	බන්දුලසේන දහනායක මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
6.	ප්‍රදීප් ඒ. පිරිස් මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7.	වෛද්‍ය එස්.කේ.ඩබ්.ජී. ගුරුසිංහ මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

05. විධායක නිලධාරී මණ්ඩලය

1.	සභාපති	-	නීතිඥ සාගලා අභයවික්‍රම මහත්මිය
2.	කළමනාකාර අධ්‍යක්ෂ	-	එල්.ආර්.ඩී.ශාන්ත කුමාර මහතා
3.	සාමාන්‍යාධිකාරී	-	පී.ඩී.ධම්මික මහතා
4.	සහකාර සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලා	-	කේ.ඩී.එම්.ඒ.චන්ද්‍රසේකර මහතා
5.	සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය	-	එම්.ජී. ගයාන් තක්ෂිල මහතා
6.	සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි	-	බී.එස්. කාරියවසම් මහතා
7.	ප්‍රධාන වෛද්‍ය නිලධාරී	-	කේ.ඒ.සී.ඩී. කොඩිකාර මහත්මිය
8.	කළමනාකරු - මුදල්	-	කැලුම් පතිරවසම් මහතා
9.	වෛද්‍ය නිලධාරී	-	එම්.කේ.එන්. ගුණසේකර මහත්මිය
10.	කළමනාකරු - සැලසුම්	-	ජගත් කෝරළගේ මහතා
11.	කළමනාකරු - මානව සම්පත්	-	එම්.නිලානි විජේසිංහ මහත්මිය
12.	වෛද්‍ය නිලධාරී	-	ටී.කේ. ලියනගේ මහත්මිය
13.	කළමනාකරු - අලෙවි	-	එච්.එම්.ඩී.ඩී. ධනංජ මහතා
14.	කළමනාකරු - තත්ව පාලන	-	කේ.ඒ.එච්.කේ. කස්තුරිආරච්චි මහතා
15.	කළමනාකරු - පිරිවැය	-	ඒ.ඩී.එස්. ප්‍රේමසිංහ මහත්මිය
16.	කළමනාකරු - කර්මාන්තශාලා	-	බී.ඩී. නවීන් කරුණාසේන මහතා
17.	කළමනාකරු - සැපයුම්	-	දීපනි වන්නිආරච්චි මහත්මිය
18.	වෛද්‍ය නිලධාරී	-	වී.එම්.එල්.එස්. නිමලරත්න මහතා
19.	වෛද්‍ය නිලධාරී	-	එච්.විමංග විජේවර්ධන මහතා
20.	වෛද්‍ය නිලධාරී	-	ඒ.එස්.ඩබ්. සේනාරත්න මහතා
21.	වෛද්‍ය නිලධාරී	-	ඩී. ෂෙහාන් රසාද් ද සිල්වා මහතා

අභ්‍යන්තර විගණන අංශය

1.	අභ්‍යන්තර විගණක	-	ඒ.ඩී.එන්.කේ. ප්‍රේමරත්න මහත්මිය

06. කාර්ය මණ්ඩල සංයුතිය


2022 වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

තනතුරු නාමය	කාර්යාලය	නිෂ්පාදනාගාරය	විජේරාම අ.මැ	නාවින්න අ.මැ	මහනුවර අ.මැ	දියතලාව අ.මැ	බදුල්ල අ.මැ	අනුරාධපුරය අ.මැ	මාතර අ.මැ	රත්නපුර අ.මැ	මොණරාගල අ.මැ	ගාල්ල අ.මැ	කොළඹ අ.මැ	යාපනය අ.මැ	මඩකලපුව අ.මැ	ජා ඇල අ.මැ	හික්කඩුව ඔසු උයන	මඩවච්චිය ඔසු උයන	දංගොල්ල ඔසු උයන	ඇඹිලිපිටිය අ.මැ	නාරහේන්පිට අ.මැ	කිරිබත්ගොඩ අ.මැ	එකතුව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	3	2																					05
කළමනාකරුවන්	6	8																					14
කණිෂ්ඨ කළමනාකරුවන්	13	2																					15
කළමනාකරණ සහකාර සේවා තාක්ෂණික නිලධාරීන්	4	12																					16
කළමනාකරණ සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන්	56	15	1	1	1	1	1	1	1	1	1	1	1	-	-	1	1	-	1	1	1	1	88
ප්‍රාථමික ගණය අර්ධ ශිල්පීය නිලධාරීන්		15																					15
ප්‍රාථමික ගණය ශිල්පීය නිලධාරීන්		11																					11
ප්‍රාථමික ගණය ශිල්පීය නොවන නිලධාරීන්	12	119	1	1	1	1	1	1	1	1	1	1	1	2	2	1	1	1	1	1	1	1	153
ස්ථීර සේවකයින්ගේ එකතුව (1)	**94**	**184**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**1**	**2**	**2**	**2**	**2**	**317**
අනියම් කම්කරු / තාවකාලික කම්කරු/ (දෛනික වැටුප්)		1	1														20	1	15				38
ස්ථීර හා තාවකාලික කම්කරු එකතුව (1)+(2)	**94**	**185**	**3**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**2**	**22**	**2**	**17**	**2**	**2**	**2**	**355**

07. කාර්ය සාධන


පිරිවැටුම

2021 වර්ෂයට සාපෙක්ෂව 18%ක පමණ වාර්ෂික පිරිවැටුම වැඩිකර ගැනීමට අපට හැකි විය. මේ සඳහා අලෙවි ජාලය පුළුල් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය අලෙවි නියෝජිතයන් පත් කිරීමද ඉවහල් වී ඇත.




නිෂ්පාදනය

අමුද්‍රව්‍ය මිල ඉහළ අගයක් ගැනීම, ප්‍රමාණවත් පරිදි අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වීම වැනි කරුණු රාශීයක් මධ්‍යයේ වුවද මිලියන 500ක පමණ නිෂ්පාදන කටයුතු කිරීමට අපට හැකි විය.



බදු පසු ශුද්ධ ලාභය/අලාභය

පෙර වර්ෂයේ අලාභ ලබා තිබුණත් මෙම වර්ෂයේ රු.මි.0.4ක පමණ ලාභයක් ලබා ගැනීමට හැකි වී ඇත.



08. සේවක දිරිදීමනා සහ සුභසාධනය

8.1 සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පහත සඳහන් දීමනා ලබා දෙනු ලැබේ.

- පැමිණීමේ දිරි දීමනාව
- නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව
- ඵලදායිතා දීමනාව
- වාර්ෂිකව ප්‍රසාද දීමනා
- ඉතිරි වෛද්‍ය නිවාඩු දීමනා

8.2 සේවක සුභසාධනය

අප සංස්ථාවේ සේවක සුභසාධනය සඳහා පහත සඳහන් වැඩ පිලිවෙළ දැනට ක්‍රියාත්මක කර ඇත.

- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා සෘජුව සම්බන්ධ වන සියළුම සේවකයින්, අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සහ රියදුරන් සඳහා නිල ඇඳුම් ලබා දී ඇත.
- සියළුම සේවකයින්ට උදැසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දීම සහ රාත්‍රී සේවය කරන ලද සේවකයින් වෙත රාත්‍රී ආහාර සැපයීම.
- අවමංගල්‍ය අවස්ථාවලදී සේවකයන් වෙත ලබාදෙන පාංශුකූල දීමනාව ලෙස රු.6,500.00ක් ලබා දීම.
- සිංහල හා හින්දු අළුත් අවුරුදු සැමරුම් වෙනුවෙන් අප්‍රේල් මස දී සෑම සේවකයෙකු සඳහාම රු.6,000.00ක තෑගි වවුචර්යක් ලබා දීම.
- පසුගිය වසර කිහිපයෙහි රට තුළ පැවති covid වෛරස තත්ත්වය මත සංස්ථා සේවකයන්ගේ වාර්ෂික චාරිකාව අත්හිටුවා තිබූ අතර, එම වසර කිහිපයෙහි අයවැය මඟින් වෙන් කල ප්‍රතිපාදන යොදා ගනිමින් සංස්ථා සේවයේ නියුතු කාර්යය මණ්ඩලයේ පවුල් සාමාජිකයින් සමඟ නැගෙනහිර පළාතේ ආරුගම්බේ මුහුදු තීරය ආවරණය වන පරිදි දින 03ක චාරිකාවක් සිදු කරන ලදි.

8.3 ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම වෙනුවෙන් අදාල අනුමත සීමාවන් යටතේ සංස්ථාවේ ඖෂධ මංජුසා ලබා දීම සහ විවිධ රාජ්‍ය සහ ඒ හා සම්බන්ධ උත්සව සඳහා පැමිණෙන ජනතාව වෙත ඔසු පැන් ලබා දීම සිදු කර ඇත.

09. ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

	ඖෂධ නාමය	ඒකකය	2022	2021	2020	2019	2018
1	අරිෂ්ට	750ml	49,706	87,385	97,084	108,603	87,288
2	ආසව	750ml	43,560	71,010	75,174	96,920	87,983
3	ක්වාථ	750ml	91,540	104,249	108,655	81,733	80,498
4	පැණිය	750ml	15,233	11,949	23,616	27,458	22,631
5	තෛල	750ml	175,376	207,305	160,621	198,599	178,257
6	චූර්ණ	1 kg	23,032	27,417	24,422	25,666	24,880
7	කල්ක	1 kg	6,620	11,639	7,247	11,144	9,099
8	ලේහ	1 kg	797	3,178	2,215	4,078	2,972
9	ලේප	1 kg	7,419	8,359	8,021	6,488	8,020
10	මෝදක	1 kg	2,494	3,832	2,153	1,099	1,208
11	රස	1 kg	1,900	2,199	1,570	2,131	3,365
12	ගුගුල්	1 kg	5,689	7,103	7,038	7,854	9,455
13	වටිකා	1 kg	4,506	5,997	4,851	7,783	6,721
14	වයින්	750ml	-	-	-	-	787
15	New Products 01						
	(1) RANAHANSA RASAYANAYA (Gajabala)	1 kg	202	64	197	263	-
	(2) THRIPALA PETHI	1 kg	1,394	1,042	1,293	1,095	852
	(3) MEDAHARANI PETHI	1 kg	1,294	1,927	821	985	1,385
	(4) JEEWALEPA	1 kg	309	459	212	339	81
16	New Products						
	(1) THAMBUM HODI	1 kg	1,017	1,802	579	808	697
	(2) PEYAWA	1 kg	1,502	3,747	2,504	2,101	1,532
	(3) PASPANGUWA	1 kg	3,660	6,990	4,498	5,503	6,827
	(4) KOMARIKA SHAMPOO	1 L	5,732	4,049	5,285	3,317	2,181
	(5) IRAMUSU POWDER	1 kg	3	-	10	39	-
	(6) WENIWEL BODY WASH	1 L	14,965	16,171	8,011	6,211	6,258
	(7) IRAMUSU TEA	1 kg	365	198	260	347	169
	(8) CINNAMON HERBAL TEA	1 kg	86	107	486	482	563
	(9) KOTHALAHIMBUTU HERBAL TEA	1 kg	211	26	438	101	74
	(10) KOTHALA HIMBUTU POWDER	1 kg	-	-	-	-	230
	(11) CINNAMON CAPSULES	1 kg	21	36	3	70	27
	(12) NELLI-RASAKINDA HERBAL TEA	1 kg	82	92	18	-	20
	(13) MEDAHARANEE CAPSULES	1 kg	94	120	22	52	38
	(14) KOTHALA HIMBUTU CAPSULES	1 kg	222	65	34	76	54
	(15) ASHWAGANDA CAPSULES	1 kg	152	101	82	52	25
	(16) DHATHREE CAPSULES	1 kg	54	66	51	41	9
	(17) SUDARSHANA CAPSULES	1 kg	613	659	413	116	36
	(18) CUCUMBER FACIAL WASH	1 L	333	290	70	619	210
	(19) PAPAYA FACIAL WASH	1 L	563	288	1,018	636	319
	(20) SANDALWOOD FACIAL WASH	1 L	1,045	1,007	471	1,119	959
	(21) CARROT FACIAL WASH	1 L	-	-	-	95	374
	(22) BEE HONEY	750ml	2	2,135	-	405	1,022
	(23) ABA THEL	750ml	315	432	264	34	48
	(24) ELAGI THEL	750ml	4,192	5,746	1,832	1,604	608
	(25) ENDARU THEL	750ml	372	643	272	89	24
	(26) KOHOMBA THEL	750ml	159	780	244	31	36
	(27)THALA THEL	750ml	2,942	6,487	2,645	1,952	2,368

	(28) PANCHA WALKALA BODY WASH	1 L	1,256	2,201	1,129	1,494	361
	(29) MEE THEL	750ml	191	134	228	18	25
	(30) PAS THEL	750ml	43	-	-	-	-
	New Products						
	(31) BELI MAL (DRIED)	1 kg	8	9	86	-	-
	(32) SUWADHARANI PRATHI. PAN.	1 kg	2,356	31,548	7,842	-	-
	(33) BULATH SAPE	1 kg	95	294	-	-	-
	(34) MIXED HERBAL TEA	1 kg	85	25	-	-	-
	(35) RAKTHA CHANDAN FACIAL WASH	1 L	317	0	-	-	-
	(36) OUSHADIYA SUWADA DOOPAYA	1 kg	12	-	-	-	-
	(37) WENIWEL LIQUID HAND SANITIZER	1 L	137	-	-	-	-
	(38) DARUPARPATHA PETHI	1 kg	69	-	-	-	-
	(39) SUDARSHANA TABLETS	1 kg	42	-	-	-	-
	(40) SAFFOOF-E-SOORANJAN	1 kg	198	293	148	192	126
	(41)WENIWEL HAND WASH	1 L	-	184	539	-	-
	(42) KAHA POWDER	1 kg	-	122	107	-	-
	(43) PRATHISHAKTHI WARDHAKA KASAYA	1 kg	-	5,019	7,056	-	-
	(44)SUDU HANDUN POWDER	1 kg	-	233	-	-	74
	(46) Narayana Thila Kalkaya (Squeezed)	1 kg	514	-	-	-	-
	(47)Nirgundiyadi Thila Kalkaya (Squeezed)	1 kg	269	-	-	-	-
	(48)Pinda Thila Kalkaya (Squeezed)	1 kg	506	-	-	-	-
	(49)OUSHADHA MANJUSA SPECIAL PACK	NOS	-	400	-	-	-
	(50)KAVALAGRAHA MOUTH WASH	1 kg	-	277	48	-	-
	(51)ETHO KOMARIKA HAND SANITIZING GE	1 L L	-	784	3,908	-	-
	(52)COVID-19 DOOMAYANAYA	1 kg	-	796	1,137	-	-
	(53)CITRONELLA MOSQUITO REPELLENT	1 L	-	278	-	-	48
	(54)BELI GATA MANDA POWDER	1kg	-	-	24	128	16
	(55)RANAWARA MAL (DRIED)	1 kg	-	-	37	-	-
	(56)PASPANGUWA POWDER	1 kg	-	-	95	-	-
	(57)PERUMKAYAM	1 kg	-	-	38	-	-
	(58) ALOE VERA HERBAL DRINK	1 L	-	-	-	546	1,600
	(59) OSU MADURU DOOPAYA	1KG	-	-	-	274	-
	(60) PEYAWA (Immunity Strengthening)	1KG	-	-	-	161	-
	(61) PEYAWA (Immunity Strengthening T-Bag)	1KG	-	-	-	3	-

10. රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ .

(රු. මිලියන)

	2022 වර්ෂය	**2021** වර්ෂය	**2020** වර්ෂය	**2019** වර්ෂය	**2018** වර්ෂය
රාජ්‍ය අංශය	730.34	593.61	517.46	585.63	541.48
අලෙවි මධ්‍යස්ථානය					
විජේරාම අලෙවි මධ්‍යස්ථානය	9.86	9.38	7.22	5.90	6.68
ජංගම අලෙවිය	19.71	45.76	22.85	20.75	21.69
මහනුවර අලෙවි මධ්‍යස්ථානය	9.87	9.15	9.60	8.27	6.63
දියතලාව අලෙවි මධ්‍යස්ථානය	5.39	4.98	4.03	2.66	5.30
අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය	11.29	7.22	14.96	17.11	15.06
බදුල්ල අලෙවි මධ්‍යස්ථානය	6.48	4.92	4.68	4.18	6.00
පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය	1.94	3.55	4.03	4.24	5.12
නාවින්න අලෙවි මධ්‍යස්ථානය	33.21	32.59	26.04	10.67	11.49
අංක 008 ගබඩාව	13.90	9.58	4.89	0.46	1.41
රත්නපුර අලෙවි මධ්‍යස්ථානය	6.78	5.33	4.83	4.01	7.19
යාපනය අලෙවි මධ්‍යස්ථානය	12.22	12.05	11.78	7.69	11.23
ගාල්ල අලෙවි මධ්‍යස්ථානය	9.84	8.99	6.48	5.03	6.18
සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය	-	-	1.38	1.85	3.44
මොණරාගල අලෙවි මධ්‍යස්ථානය	6.60	7.78	5.46	3.67	4.49
මාතර අලෙවි මධ්‍යස්ථානය	9.11	10.74	9.47	6.14	7.11
බොරැල්ල අලෙවි මධ්‍යස්ථානය	10.53	7.73	8.09	7.73	8.17
මාතලේ අලෙවි මධ්‍යස්ථානය	1.72	3.61	3.90	3.51	4.33
අළුත්ගම අලෙවි මධ්‍යස්ථානය	-	-	1.07	3.00	2.01
ජා ඇළ අලෙවි මධ්‍යස්ථානය	8.99	7.13	2.26	2.46	0.84
බස්නාහිර පළාත් අලෙවි මධ්‍යස්ථානය	2.51	5.44	3.92	0.68	-
බේරුවල අලෙවි මධ්‍යස්ථානය	7.97	7.60	1.89	-	-
සුවසිරිපාය අලෙවි මධ්‍යස්ථානය	-	-	-	-	0.03
නාරහෙන්පිට අලෙවි මධ්‍යස්ථානය	4.22	1.98	-	-	-
කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය	3.96	-	-	-	-
ඇඹිලිපිටිය අලෙවි මධ්‍යස්ථානය	9.47	1.14	-	-	-
මුළු එකතුව	**935.91**	**800.26**	**676.29**	**705.64**	**675.88**

11. ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

	2022	2021	2020	2019	2018
විකුණුම්	100.00	100.00	100.00	100.00	100.00
අඩු කළා :- විකුණුම් පිරිවැය	72.30	74.21	69.77	68.77	62.74
දළ ලාභය	27.70	25.79	30.23	31.23	37.26
එකතු කළා - වෙනත් ආදායම්	1.48	1.65	1.28	2.12	1.08
එකතුව	29.18	27.44	31.52	33.35	38.34
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	19.76	19.11	19.98	21.37	21.41
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	11.06	10.45	11.88	12.94	12.75
මූල්‍ය වියදම්	0.46	1.28	0.82	0.90	1.06
මුළු වියදම	31.28	30.84	32.67	35.21	35.22
මෙහෙයුම් ලාභය	(2.10)	(3.40)	(1.16)	(1.86)	3.11
එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම්	2.20	1.59	2.56	2.30	1.34
බදු අඩු කිරීමට පෙර ලාභය	0.11	(1.81)	1.40	0.45	4.46
අඩු කළා					
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	0.06	-	0.50	0.35	1.73
ශුද්ධ ලාභය	**0.04**	**(1.81)**	**0.90**	**0.09**	**2.72**

12. ලාභ දායකත්වය (රු. මිලියන වලින්)

(රු. මිලියන)

	2022	2021	2020	2019	2018
විකුණුම්	935.89	800.22	676.30	705.62	675.88
අඩු කළා :- විකුණුම් පිරිවැය	676.65	593.82	471.83	485.23	426.05
දළ ලාභය	259.24	206.40	204.47	220.39	249.83
එකතු කළා - වෙනත් ආදායම්	13.87	13.21	8.69	14.94	7.29
මුළු ආදායම	273.11	219.61	213.16	235.33	257.12
අඩු කළා					
ආයතන හා පරිපාලන වියදම්	184.92	152.91	135.10	150.80	144.74
විකිණීමේ හා බෙදා හැරීමේ වියදම්	103.53	83.63	80.34	91.28	81.30
මූල්‍ය වියදම්	4.29	10.27	5.54	6.37	7.15
මුළු වියදම	292.74	246.81	220.98	248.45	233.19
මෙහෙයුම් ලාභය/අලාභය	(19.63)	(27.20)	(7.82)	(13.12)	23.93
එකතු කළා - පොළී ආදායම්	20.64	12.70	17.28	16.26	9.07
බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන	(0.59)	-	(3.36)	(2.50)	(11.72)
ශුද්ධ ලාභය/අලාභය	**0.42**	**(14.50)**	**6.10**	**0.64**	**21.28**

13. තිරසාර සංවර්ධනය අරමුණු සාක්ෂාත් කර ගැනීම

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් 2015 වර්ෂයේ දී එකඟ වී ඇති තිරසාර සංවර්ධන අරමුණු මූලික කරගත්, වර්ෂ 2030 දී සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා රජය විසින් ඉලක්ක කර ඇති පහත සඳහන් අරමුණු සඳහා 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සෘජු දායකත්වයක් දක්වා ඇත.

1. වන අරමුණ - දරිද්‍රතාවයෙන් තොර වීම.
2. වන අරමුණ - කුසගින්න තුරන් කිරීම.
3. වන අරමුණ - නීරෝගී බව හා යහපැවැත්ම.
4. වන අරමුණ - සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය.
5. වන අරමුණ - වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය.

14. නිෂ්පාදනය වැඩි කිරීම

- **අමුද්‍රව්‍ය සපයා ගැනීම**

රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය තුළ දේශීය අමුද්‍රව්‍ය මෙන්ම ආනයනික අමුද්‍රව්‍ය මිල සිසු ලෙස ඉහළ ගොස් ඇත. මේ හේතුවෙන් අප නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම දුෂ්කර මෙන්ම සපයා ගත හැකි අමුද්‍රව්‍ය වලට ද විශාල පිරිවැයක් දැරීමට සිදු විය. බොහෝ අවස්ථාවලදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රම යටතේ සැපයුම්කරුවන් වෙත ටෙන්ඩර් ප්‍රධානය කළ ද, මාස කිහිපයක්වත් අඛණ්ඩ සැපයුමක් සිදු කිරීමට ඔවුන්හට නොහැකිව පවති.

2020 වසරේ සිට ආනයන සීමා පැනවීම මත කහ සහ ඉඟුරු දේශීයව සපයා ගැනීමට යොමු වූ අතර මේ වන විට එම අමුද්‍රව්‍ය බොහෝමයක් සංස්ථාව භාරයේ පවතින ඔසු උයන් වලින් ලබා ගැනීමටත්, ආනයනික මිලදී ගැනීම් නවතා දැමීමට අපට හැකි වී ඇත.

එමෙන්ම දේශීයත්වයට මුල් තැනදෙමින් අවම වශයෙන් මාස 3කට වරක් මහියංගනය, දඹාන ප්‍රදේශ වලින් සංස්ථාවේ කාර්යය මණ්ඩලය යොදවා අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ කටයුතු සිදු කරනු ලබයි. මෙම කාර්යය 2020 වර්ෂයේ සිට මේ දක්වා අඛණ්ඩව සිදු කෙරෙන අතර අරළු, බුළු, නෙල්ලි ආදි අමුද්‍රව්‍ය බහුල ලෙස මිලදී ගෙන ඇත.

15. ඔසු උයන් පාලනය

- **නිකවැරටිය ඔසු උයන**

  සංස්ථාව භාරයේ පවතින වතු වල ජල සැපයුම ඉතා අවම මට්ටමක පවති. වසර ගණනාවක සිට නිකවැරටිය ඔසු උයනෙහි පැවති ජල සම්පාදන ගැටළුව සඳහා පිළියමක් වශයෙන් එහි පැවති කුඩා ප්‍රමාණයේ වැව ප්‍රතිසංස්කරණය කර, ඇළ මාර්ගයක් මඟින් එම ප්‍රදේශයේ තවත් වැවකින් ජල සැපයුම ලබා ගැනීමට 2022 වර්ෂයේදී කටයුතු කර ඇත.

  රාජ්‍ය අයවැය මඟින් වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 2කට ආසන්න මුදලක්, දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ ලබා ගනිමින් මීට අදාළ වියදම් සිදු කර ඇත.









වසර ගණනාවක සිට සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන මෙම ඔසු උයනෙහි දිර්ඝ කාලීන බෝග ලෙස රත්හඳුන්, සුදුහඳුන්, දෙළුම් මෙන්ම ඉඟුරු, කොමාරිකා, කොල්ලං කොළ, ඉරිවේරිය, කප්පරවල්ලිය වැනි කෙටිකාලීන බෝග ද වගා කර ඇත.

- **දංගොල්ල ඔසු උයන**

  අක්කර 35කින සමන්විත වන මෙම ඔසු උයනෙහි පලොල්, තොටිල, නෙල්ලි, ආඩතොඩ, ඇඹුල් දොඩම්, බුළු වැනි දීර්ඝ කාලීන බෝග මෙන්ම කිරාත, කහ, හීන් අරත්ත වැනි කෙටි කාලීන බෝග ද වගා කර එහි ඵලදාව සංස්ථාවේ නිෂ්පාදන කටයුතු සඳහා ලබා දී ඇත.

එමෙන්ම ජල සම්පාදන කටයුතු ප්‍රශස්ථ කිරීම සඳහා ඩීසල් මඟින් ක්‍රියා කරවන අඟල් 2ක වතුර පොම්පයක් ස්ථාපනය කිරීමත්, ජල සම්පාදන පද්ධතිය සකස් කිරීම සඳහා මූලික පියවරක් වශයෙන් කෘෂිකර්ම දෙපාර්තමේනතුව හා සම්බන්ධ වී මූලික විස්තර සැලැස්ම නිර්මාණය කිරීම සිදු කර ඇත. එමෙන්ම 2022 වර්ෂය තුළදී ඖෂධ වර්ග වේලීම සඳහා වර්ග අඩි 1600ක පමණ විශාලත්වයෙන් යුතු කමතක් සාදා නිම කරන ලදි.

- **මැදවව්විය ඔසු උයන**

  මෙම ඔසු උයනේ මස්බැද්ද, අත්තන සහ මුල සහ පොල් වගාවන් සිදු කර ඇත.

16. නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීම

- **ප්‍රාග්ධන ව්‍යාපෘති**

600 Liters Stainless Steel Machine 02, 1200 Liters Stainless Steel Machine 01

පවතින මූල්‍ය අර්බුදය තුළ විශාල ප්‍රමාණයේ ප්‍රාග්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට 2022 වර්ෂයේ කටයුතු කර නොමැත. උඳුන් අංශයේ අමුද්‍රව්‍ය තැම්බීම සඳහා භාවිතා කරන භාජන වල නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කර ගැනීම සඳහා රුපියල් මිලියන 20ක පමණ ආයෝජනයක් සිදු කර, 600L ධාරිතාවයෙන් යුතු භාජන 02ක් සහ 1200L ධාරිතාවයෙන් යුතු භාජනයක් මිලදි ගැනීමට 2022 වර්ෂයේදී කටයුතු කර ඇත.



17. නව නිෂ්පාදන හඳුන්වාදීම සහ අලෙවි ප්‍රවර්ධනය

- **නව නිෂ්පාදන හඳුන්වා දීම**

තිලාදි ලේපය, වෙනිවැල් හැන්ඩ් සැනිටයිසර්, දාරු පර්පට පෙති, සුදර්ශන පෙති, රක්තවන්දන් ෆේෂ් වොෂ් යන නව නිෂ්පාදන කිහිපයක් වෙළඳපලට හඳුන්වා දීම 2022.05.27 දින සංස්ථා පරිශ්‍රයේදී සිදු කරන ලදි.











- **නව අලෙවි ශාඛා පිහිටු වීම**
  - **කිරිබත්ගොඩ අලෙවි මධ්‍යස්ථානය**

සංස්ථාවේ අලෙවි ජාලය පුළුල් කිරීමේ අරමුණින් කිරිබත්ගොඩ ප්‍රදේශයේ නව අලෙවි ශාඛාවක් 2022.07.15 වන දින ආරම්භ කරන ලදි.





- **අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්**

රජය සහ රජයට අනුබද්ධිත ආයතන සහ ජනතාව ගැවසෙන ස්ථාන ආවරණය වන පරිදි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 25කට ආසන්න සංඛ්‍යාවක් 2022 වර්ෂයේදී සංවිධානය කර ඇත.

වැඩසටහන පැවැත්වූ මාසය	පැවැත් වූ ආයතනය / ස්ථානය
ජනවාරි	- නගර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන - කිරිබත්ගොඩ නගරය
පෙබරවාරි	- නගර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන - නුගේගොඩ නගරය - නගර අලෙවි ප්‍රවර්ධන වැඩසටහන - නාරහෙන්පිට නගරය
මාර්තු	- කුරුවිට හයිඩ්‍රාමනී ආයතනය
සැප්තැම්බර්	- BMICH වෛද්‍ය ප්‍රදර්ශනය - කම්කරු කාර්යාලය - නාරහේන්පිට
ඔක්තෝබර්	- නැවි සංස්ථාව
නොවැම්බර්	- RDB බැංකුව - ජනාධිපති විද්‍යාලය - මහර - ඩෙන්සිල් කොබ්බැකඩුව පාසල - හාලි ඇළ - ජල සම්පාදන මණ්ඩලය - මාතර - නීතීඥ සංකීර්ණය - මහනුවර - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇඹිලිපිටිය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බදුල්ල - සති පොළ - මොණරාගල - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දියතලාව - මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව - නාරහේන්පිට - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මාතර - NSB බැංකුව - බදුල්ල - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - දක්ෂිණපාය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
දෙසැම්බර්	- මහවැලි අධිකාරි - ඇඹිලිපිටිය - දෙහිවල සත්වෝද්‍යානය - ජනාධිපති විද්‍යාලය - මහර - නගර සභාව - අනුරාධපුර

- **දිස්ත්‍රික් අලෙවි නියෝජිතයින් පත් කිරීම**

පෞද්ගලික අංශය ද සම්බන්ධ කර ගනිමින් සංස්ථාවේ අලෙවිය හා බෙදාහැරීමේ ජාලය තවදුරටත් පුළුල් කර ගැනීම සඳහා දිස්ත්‍රික් බලයලත් අලෙවි නියෝජිතයින් පත් කර ගැනීමට 2022 වර්ෂයේ දී කටයුතු කර ඇත.





ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - විගණන කමිටු වාර්තාව - 2022

2010/12/14 දිනැති අංක පී.ඊ.ඩී 55 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ විගණන කමිටුව පිහිටුවා ඇත.

එම චක්‍රලේඛය අනුව විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත හා අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කරගැනීම, අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි, පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම, රජය විසින් නිකුත් කරන ලද නීති, රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට ඇති අනුකූලතාවය සමාලෝචනය කිරීම, ඇගයීම හා අනුකූල නොවීම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය විය යුතුවේ.

ආයතනයේ විගණන කමිටුව භාණ්ඩාගාර නියෝජිත ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන්දෙනෙකුගෙන් සමන්විත වූ අතර විගණන කමිටුවේ සභාපතිත්වය දරණු ලබන්නේ භාණ්ඩාගාර නියෝජිත වන අධ්‍යක්ෂවරයාය.

විගණන කමිටු රැස්වීම් සඳහා ජාතික විගණන කාර්යාලයෙන් විගණන අධිකාරීවරයෙකු නිරීක්ෂක ලෙස සහභාගී විය.

2022.02.02 දින දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී වූ අතර 2022.06.28 දින සිට දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එස්. අයි. සී. තුෂාරිකා මිය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී විය.

විගණන කමිටුවේ ලේකම් ලෙස අභ්‍යන්තර විගණක කටයුතු කරන අතර විගණන කමිටුවට වාර්තා ඉදිරිපත් කිරීම හරහා විගණන කමිටුවට සහය වනු ලබයි.

විගණන කමිටුවේ ආරාධනය මත ආයතනයේ ඉහළ කළමනාකාරිත්වය විගණන කමිටු රැස්වීම් වලට සහභාගී විය.

2022 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් හතරක් (4) පවත්වා ඇති අතර කමිටු සභාපති, නිරීක්ෂකයන් හා සාමාජිකයන් ඇතුළු සියලුදෙනා සෑම විගණන කමිටුවක් (2022.02.02, 2022.06.28, 2022.09.28 හා 2022.12.13 දිනයන්හිදී) සඳහාම සහභාගී වී ඇත.

2022 වර්ෂය තුළ කමිටුව විසින්,

- බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු සම්බන්ධයෙන් අදාළ අංශ ප්‍රධානීන්ගේ පිළිතුරු අවධානයට යොමු කර ඒවා නිවැරදි කිරීම සඳහා අදාළ කළමනාකාරිත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සැළකිල්ලට ලක්කර ඇත.
- ආයතනයේ කාර්යන් කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් පවත්වාගෙන යාම සඳහා ආයතනයේ විවිධ ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන ක්‍රමවල ප්‍රමාණාත්මකභාවය පිළිබඳ විමර්ශණය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කර ඇත.
- කමිටුව විසින් ලබාදී ඇති නිර්දේශ සම්බන්ධයෙන් , අදාළ අංශ ප්‍රධානීන් විසින් ගෙන ඇති පසු විපරම් කටයුතු පිළිබඳ අවධානය යොමු කර ඇත.
- 2021 හා 2022 වර්ෂයන් තුළ ජාතික විගණන කාර්යාලය මඟින් නිකුත් කරන ලද විගණන විමසුම් හා විගණකාධිපති වාර්තාවන් පිළිබඳ අවදානය යොමු කර පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් හා ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා දී ඇත.
- ආයතනයේ ඉතා වැදගත් වත්කමක් වන තොගය සම්බන්ධ ගැටළු පවතින බවට හඳුනාගැනීමෙන් අනතුරුව දැනට පවතින පැරණි ගබඩා ක්‍රියාපටිපාටිය සැළකිල්ලට ගනිමින් නව ගබඩා ක්‍රියාපටිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට නිර්දේශ කර ඇත.

- 2023 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම හා විගණන සැලැස්ම එකිනෙකට අනුගතවන ලෙස සකස් කර නියමිත දිනදී සකස් කර ඉදිරිපත් කිරීමට හා ක්‍රියාත්මක කිරීමටත්, එමඟින් ආයතනයෙහි කාර්ය සාධනය ඉහළ නැංවීමටත් ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කර ඇත.

විගණන කමිටු සංයුතිය

01. වන්ද්‍රිකා සේනානායක මිය - භාණ්ඩාගාර නියෝජිත (කමිටු සභාපති)

02. ගීතාමනි සී. කරුණාරත්න මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)

03. ප්‍රදිප් ඒ පිරිස් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (කමිටු සාමාජික)

04. එස්. අයි. සී. තුෂාරිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (දේ.වෛ.රාජ්‍ය අමා.) (කමිටු සාමාජික)

05. කේ. කන්දගේ මහතා - රජයේ විගණන අධිකාරී - (කමිටු නිරීක්ෂක)

➢ 2022.02.02 දින දක්වා භාණ්ඩාගාර නියෝජිත වශයෙන් ආර්.කොළඹගේ මිය කටයුතු කළ අතර 2022.06.28 දින සිට වන්ද්‍රිකා සේනානායක මිය කටයුතු කරන ලදී.

➢ 2022.02.02 දින දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී වූ අතර 2022.06.28 දින සිට දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී එස්. අයි. සී. තුෂාරිකා මිය අමාත්‍යාංශයේ නිරීක්ෂක ලෙස සහභාගී විය.

වන්ද්‍රිකා සේනානායක
කමිටු සභාපති
2023.03.14

ස්තුතිය

- නිවැරදි මහ පෙන්වීමක් කළ සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාටත්, දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමාටත්,
- දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සංස්ථාවේ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා සහාය දුන් මහා භාණ්ඩාගාරයටත්,
- නොමද සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත් පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මහපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමු.

නීතිඥ සාගලා අභයවික්‍රම
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ආයතනික පාලන වාර්තාව

ආයතනික පාලනය යනු ඉහළ විනිවිදභාවය, නිරවද්‍ය හා කාලීන මූල්‍ය වාර්තාකරණය සාක්ෂාත් කිරීම මඟින් ආයතනයට සම්බන්ධ පාර්ශවයන්ගේ (රජය සහ ප්‍රජාව, ආයෝජකයින්, සේවකයින්, සැපයුම්කරුවන්, පාරිභෝගිකයින්) අභිමතාර්ථ සාධනය උදෙසා කළමනාකරණය විසින් ආයතන අධ්‍යක්ෂණය සහ පාලනය කරන ක්‍රම පිළිවෙලයි.

සංස්ථාපිත පාලන සම්බන්ධ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

- **අධ්‍යක්ෂ මණ්ඩලය**

අධ්‍යක්ෂ මණ්ඩලය, නිෂ්පාදනය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය හා ආශ්‍රිත සේවා, අලෙවිකරණය, රාජ්‍ය මූල්‍ය හා පරිපාලනය යන ක්ෂේත්‍රයන්හි ව්‍යාප්තිමය සහ අත්දැකීම් බහුල පුද්ගලයන්ගෙන් සැදුම් ලබයි.

විධායක අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා සහ කළමණාකාර අධ්‍යක්ෂවරයෙකුගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරු පස් දෙනෙකු ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවකදී හෝ ගරු ඇමතිවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කර නොමැති විටකදී හැර අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වේ. අවශ්‍ය විටකදී විශේෂ රැස්වීමක් පැවැත් වීමටද කටයුතු කරනු ලැබේ.

- **කළමනාකරණ කමිටුව**

සංස්ථාපිත කළමනාකරණ කමිටුවේ සභාපති තනතුර සංස්ථාවේ සභාපතිවරයා විසින් හොබවනු ලැබේ. අනෙකුත් කමිටු නිළධාරීන් වන්නේ සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂ, සාමාන්‍යාධිකාරි, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ය.

සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධ තීරණ ගැනීම, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කරන ආකාර, උපාය මාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීම මෙන්ම අවශ්‍ය විටෙක ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සුදුසු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ආදී කටයුතු කළමනාකරණ කමිටුව මඟින් සිදුකෙරේ. කළමනාකරණ කමිටුව මාසිකව රැස්වේ.

- **විගණන කමිටුව**

“ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ“ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලව විගණන කමිටු පිහිටුවා ඇත.

විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ සභාපති වේ. සංස්ථාවේ කාර්යයන් පරීක්ෂා කිරීම සහ ඇගයීම විගණන කමිටුව විසින් ස්වාධීනව කරනු ලබන අතර අවශ්‍ය අවස්ථා වලදී කළමනාකාරීත්වයට අවශ්‍ය මගපෙන්වීම් සිදු කිරීම. අභ්‍යන්තර විගණන කාර්යයන්, විගණන කමිටුවේ අනුමැතිය මත පිළියෙල කරන අතර අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කෙරෙන කටයුතු විගණකාධිපතිවරයාගේ දැනුවත් වීමට ද යොමු කෙරේ

- **ආයෝජකයන්ගේ සම්බන්ධතා සහ පොදු වගකීම**

සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරුවන් ආයතනය පාලනය කිරීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය ලෙස සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයටත්, මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරයටත් වගකිව යුතු වේ. මෙම වගකීම සපුරාලමින් වාර්ෂික වාර්තාව, වාර්ෂික ගිණුම්, වාර්ෂික අයවැය, කාර්තු සඳහා ප්‍රගති වාර්තා ආදිය එම ආයතනවලට ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධව අවසාන අධිකාරි බලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව පවතින බැවින් ආයතනයේ ප්‍රගතිය, මූල්‍ය වාර්තා, විගණන වාර්තාව ඇතුළත් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

ලාභ අරමුණු කර ගත් රාජ්‍ය ව්‍යාපාරයක් ලෙස ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර සඳහා වන පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) වග කියනු ලැබේ.

- **වේතන ප්‍රතිපත්තිය**

සංස්ථාවේ වැටුප් ප්‍රතිපත්තිය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් සහ චක්‍රලේඛ මත පිහිටුවා සකසා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල දීමනා, මුදල් අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සංස්ථා වලට අදාළව නිකුත්කර ඇති චක්‍රලේඛ මත පදනම්ව ගෙවනු ලැබේ.

මාසික නිෂ්පාදනය හා සේවක පැමිණීම පාදක කර ගනිමින් නිෂ්පාදන සහ පැමිණීමේ දිරිදීමනා සියලුම සේවකයන් වෙත මාසිකව ගෙවනු ලබයි.

- **අභ්‍යන්තර පාලනය**

ආයතනය විසින් එළඹෙන සියලු ගනුදෙනු සඳහා නියමිත අධිකාරිය ලැබුන බවටත්, සටහන් ගත කිරීම හා වාර්තා කිරීම, නිර්දේශ කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම යන කරුණු සම්බන්ධයෙන් සාධාරණ තහවුරු කිරීමක් ඇතිවන පරිදි අභ්‍යන්තර පාලනය සැලසුම කොට ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

කාර්යයන් මත පදනම් වූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක වේ. නියමිත කාර්යයන් අනුව දෙපාර්තමේන්තු සැලසුම් කර ඇති අතර ඒවා නිෂ්පාදන, තත්ත්ව පාලන, නඩත්තු, මුල්‍ය, සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන, අලෙවිකරණ ආදී වශයෙන් වෙනි.

කළමනාකාර අධ්‍යක්ෂක සහ සාමාන්‍යාධිකාරි, සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරයි. සංස්ථාව් ප්‍රධාන විධායක නිලධාරී වන සාමාන්‍යාධිකාරි වෙත එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සෘජුවම වාර්තා කරයි.

අභ්‍යන්තර විගණකගේ ස්වාධීනත්වය තහවුරු කර ඇති අතර අභ්‍යන්තර විගණක සෘජුවම සභාපතිවරයාට සහ විගණන කමිටුවට වාර්තා කිරීම මඟින් අභ්‍යන්තර පාලනය තව දුරටත් ශක්තිමත් කෙරේ. රජයේ විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික විගණන වාර්තාව මත පදනම්ව ඒ ඒ අංශවල පවත්නා දුර්වලතා මඟහරවා ගැනීමට, සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය සහ විගණන කමිටුවේ අවශ්‍ය මගපෙන්වීම් සිදු කරනු ලබයි.

මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධිවිධාන සහ ඒ හා සම්බන්ධ චක්‍රලේඛන මත පදනම්ව සිදු කෙරෙන අතර ගණුදෙනු වල විනිවිදභාවය තහවුරු කිරීමට ඒ ඒ මිලදී ගැනීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු පත්කර ඇත.

අපේක්ෂිත අදායම්, පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වාර්ෂික අයවැය ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර රේඛීය අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මගේ අංකය
எனது இல.
My No. MED/A/ADC/FA/22/03

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 නොවැම්බර් 09 දින

16 NOV 2023
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
පරණ කොට්ටාව පාර,
නාවින්න, මහරගම

සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, රජයේ ප්‍රදාන වශයෙන් සමාලෝචිත වර්ෂය දක්වා ලැබී නිබුණු එකතුව රු.304,227,234 ක්වූ ස්ථාවර වත්කම්වලට අදාළ රු.19,487,730 ක්වූ සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ප්‍රමාණය විලම්භිත අදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ මුළු ක්ෂය වෙන්කිරීම් ප්‍රමාණය වූ රු.57,091,291 කට ක්‍රමක්ෂය ප්‍රමාණය හිලව් කර ශුද්ධ වෙනස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නිබුණි.

(ii) ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නිබුණු මූල්‍ය ප්‍රකාශවල අගයන් ආසන්නතම රුපියලට වටයා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපලට හඳුන්වාදීමේ හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2015 මැයි 26 දින රු.15,000,000 ක ප්‍රදානයක් සංස්ථාවට ලබා දී තිබුණු නමුත් මෙම මුදල් ප්‍රදානය ප්‍රමිතයේ 88 ඡේදය ප්‍රකාරව ආදායමක් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ජංගම වගකීමක් නිරූපනය වී තිබුණි.

(ආ) පහත සඳහන් නිරීක්ෂණවලට අනුව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ඉතිරි තොගවල අගය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි සඳහන් නියමයන්ට අනුකූලව හඳුනාගෙන නොතිබුණි.

(i) සංස්ථාවේ ගබඩා 03 ක සහ දිවයින පුරා පිහිටි ඖෂධ අලෙවිසැල් 17 ක පැවැති නිමි තොග සම්බන්ධයෙන් ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව, ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට තොග ලෙජර පවත්වා තිබුණද එම තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තිරු යාවත්කාලීන කර නොතිබුණි. ප්‍රමිතයේ 27 හා 28 ඡේද ප්‍රකාරව තොග ලෙජර නිවැරදිව පවත්වා ගෙන යාමෙන් නිරායාසයෙන් ලැබෙන ඉතිරි තොග අගය ශුද්ධ උපලබ්ධි අගය සමඟ සසඳා ඉන් අඩු අගය වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීම වෙනුවට තොග ලෙජරයේ ඉතිරි ඒකක සංඛ්‍යාව ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැයකින් වැඩිකර 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ අගය රු.177,928,072 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි. තවද, නිමි ඖෂධ තොග ලෙජර ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් ක්‍රමයට පවත්වා තිබුණු නමුත් ඉතිරි නිමි ඖෂධ තොග හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය පදනම් කරගෙන ගණනය කර ගිණුම්ගත කළ බවට වූ සාවද්‍ය ප්‍රකාශයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් හෙළිදරව් කර තිබුණි.

(ii) ගිණුම්ගත කර තිබුණු රු.96,125,058 ක් වූ අමුද්‍රව්‍ය තොගය, රු.177,928,072 ක් වූ නිමි ද්‍රව්‍ය තොගය හා රු.39,356,268 ක් වූ ඇසුරුම් ද්‍රව්‍ය තොගය යන තොග සම්බන්ධයෙන් භෞතික තොග ආගණනය කරන කාල සීමාව තුළ තොග සංචලන ක්‍රියා අත්හිටුවීමට හෝ මෙහෙයුම් ක්‍රියාවලියේදී උක්ත කාල සීමාව තුළ සංචලනය විය හැකි තොග ප්‍රමාණය ඇස්තමේන්තු පදනම මත වෙන්කර තැබීමට හෝ කටයුතු කර නොතිබුණු අතර සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය පවත්වාගෙන යන අතර තුර භෞතික තොග ආගණන කටයුතුද සිදුකර තිබුණි. ඒ අනුව එක් එක් භාණ්ඩයට අදාල භෞතික තොග ආගණන කාලසීමාව තුළ තොග ලැබීම් හා නිකුත් කිරීම් භෞතික තොග සමීක්ෂණ වාර්තාවල ශේෂයන්ට ගැලපිය යුතු වූවද එසේ සිදුකළ බවට සාක්ෂි නොතිබුණි.

(iii) තොග ආගණනයේදී ඒකක පිරිවැය රු.1,294.13 ක් වූ මිලිලීටර් 750 කැඩුම් බිඳුම් තෙල් බෝතල් 203 ක ඒකක පිරිවැය රු.129,413ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.26,008,131කින්ද, මිලි ලිටර් 100 මි පැණි බෝතල් 9665 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු. 1,609,264 කින්ද, හාෂ්කර ලවන කිලෝග්‍රෑම් 1098 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු.1,034,847 කින්ද, අමුද්‍රව්‍ය ගබඩාවේ නොතිබුණු ඖෂධ 03 ක් වැඩියෙන් ගණනය කිරීම හේතුවෙන් රු.120,508 කින්ද වශයෙන් රු.28,772,750 කින් අවසන් තොගය වැඩියෙන් දක්වා තිබුණු අතර නාවින්න අලෙවි සැලේ පැවැති නිෂ්පාදන 189 කට අයත් ඒකක 8673 ක් තොග ආගණනයේදී අතහැරීම හේතුවෙන් රු.1,975,542 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවල හා ඖෂධ අලෙවිසැල්වල පැවැති හානිවූ හා කල් ඉකුත්වූ තොග වෙනුවෙන් රු.8,670,825 ක් වෙන් කර තිබුණු නමුත් හානිවූ හා කල් ඉකුත් තොගයේ තථ්‍ය වටිනාකම රු.12,885,943 ක් වූයෙන් ඌණ වෙන් කිරීම රු.4,215,118 ක් විය. තවද, ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හානි වූ හා කල් ඉකුත් වූ නිමි ඖෂධ ඒකක 133,873 ක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය රු.3,287,068 ක් වුවද එදිනට හානි වූ තොග සඳහා වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.4,343,168 ක් වූයෙන් රු.1,056,100 ක අධි වෙන් කිරීම ඉකුත් වර්ෂයේ ලාභයට හඳුනාගත යුතු වුවද, ඒ සඳහාද අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(v) සංස්ථාව සතු ඔසු උයන්වලින් සපයා ගනු ලබන වියලි ඔසු අමුද්‍රව්‍යවල පිරිවැය හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී ඔසු උයන්වලින් ලැබී තිබුණු වියලි ඔසු අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4,665 ක් රු.1 බැගින්ද කිලෝග්‍රෑම් 21,423 ක් පවත්නා වෙළඳපල මිල යටතේ ද රු.6,196,457 කට අගය කර ගිණුම්ගත කර තිබුණි.

(vi) වාර්ෂික තොග සමීක්ෂණ වාර්තා අනුව ගබඩා අංක 14 හි පැවැති භාවිතයට ගත හැකි ගොඩනැගිලි ද්‍රව්‍ය, විදුලි උපකරණ හා උපාංග, යන්ත්‍ර උපකරණ අමතර කොටස්, ජලනල උපාංග හා වෙනත් ද්‍රව්‍ය වර්ග 284 කින් ඒකක 2234 ක් හා භාවිතයට ගත නොහැකි ඒකක 285ක්ද තොග ගිණුම්ගත කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(vii) රස ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා රන් තොගය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02හි 28 ඡේදය ප්‍රකාරව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගිණුම්ගත කළ යුතු වුවද, සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට ඉකුත් වර්ෂය දක්වා එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති වෙළඳපල වටිනාකමට ප්‍රත්‍යාගණනය කරමින් ගිණුම්ගත කර තිබුණි. ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ නිර්දේශ අනුව රන් තොගයේ පිරිවැය නිවැරදිව ගණනය කර ගිණුම් තැබීම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා වාර්ෂිකව ප්‍රත්‍යාගණන සංචිත ගිණුමකට මාරුකර තිබුණු රු.13,558,612 ක් වූ බැර ශේෂ එකතුව 2021 වර්ෂයේ රු.15,400,257 ක් වූ රන් තොගයට එරෙහිව කපාහැරීම වෙනුවට 2012 වර්ෂයට අදාළ ප්‍රත්‍යාගණන සංචිතය හැර ඉන් පසු වර්ෂවලට අදාළ සංචිතවල එකතුව වූ රු.9,838,562 ක් පමණක් ගැලපීම් කර

තිබීම හේතුවෙන් තවදුරටත් අදාළ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ රු.3,720,050 ක ශේෂයක් ඉතිරිව තිබුණු අතර එම ප්‍රමාණයෙන් රන් තොග ගිණුමේ ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 ට පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගයට ගිණුම්ගත කළ රන්, අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගනිමින් සිදු කෙරෙන නිෂ්පාදනවල වෙළඳපොල අගය, විකුණුම් මිල හා අදාළ වෙනත් ආර්ථික තීරණ ගැනීම සඳහා රන්තොගයේ වෙළඳ පොල වටිනාකම ගිණුම් සටහන් යටතේ හෙලිදරව් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ වසා දැමුණු ස්ථාවර තැන්පතු 07 ක දළ මුදල් ලැබීම් රු.254,054,981.93 ක් හා අලුතින් ආරම්භ කළ ස්ථාවර තැන්පතු 05ක රු.175,000,000 ක්වූ මුදල් යෙදවීම් යථෝක්ත ප්‍රමිතයේ 21 ඡේදය ප්‍රකාරව වෙන වෙනම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වාර්තා කර ලැබිය යුතු පොලිය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම වෙනුවට ශුද්ධ පදනම මත මුදල් ගලා ඒමක් ලෙස වාර්තා කර තිබුණි.

(ii) භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම් යථෝක්ත ප්‍රමිතයේ 14(ඇ) ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහයන් යටතේ වාර්තා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ණයවර ලිපි ආන්තික ගිණුම මඟින් ආනයන භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවා තිබුණු රු.11,985,681.42 ක් ආයෝජන ක්‍රියාකාරම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වාර්තාකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12 ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඉදිරියට ගෙනයන වත්කම් හා වගකීම් ප්‍රමාණය හා බදුකරණය සඳහා සලකා බැලූ වත්කම් හා වගකීම් ප්‍රමාණය අතර ඇතිවන තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් හා විලම්බිත බදු වගකීම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බැවින් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවලද 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අබන්ධව අදාළ ගැලපුම් සිදු කර තිබුණද, 2017 වර්ෂයේ සිට කිසිදු තාර්කික පදනමකින් තොරව එම ගිණුම්කරණ ප්‍රතිපත්තිය අත්හැර දමා තිබුණි. එසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබුණු රු.1,804,601 ක්වූ විලම්භිත බදු වත්කම් ශේෂය නිරවුල් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය දක්වාම අබන්ධව ජංගම නොවන වත්කම් යටතේ වාර්තා කර තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රමිතයේ 36 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරන අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, පිරිවැය රු.41,010,767ක්වූ මෝටර් රථ වාහන 27කින් පිරිවැය රු.37,573,800ක්වූ මෝටර් රථ 18ක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. තවද,

ප්‍රත්‍යාගණනය නොකරන ලද මෝටර් රථ 09 ට අදාළ ක්ෂය වෙන්කිරීම් රු.2,528,501ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන් කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගිණුම්ගතකර තිබුණි.

(ii) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.2,336,967 ක් වූ වාහන 09 ක් හා පිරිවැය රු.4,335,176 ක් වූ ඉන්වෙන්ට්‍රි අයිතම් 215ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් තිබුණද, ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර, ඇස්තමේන්තුගත දෝෂ හඳුනාගෙන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, ආයු ගණක ක්‍රමය (Actuarial method) භාවිතා කරමින් වෘත්තීය ගිණුම්කරණ ආයතනයක් විසින් සිදුකර තිබුණු ගණනය කිරීම් අනුව 2018 දෙසැම්බර් 31 දිනට නිරත සේවකයින් 383 දෙනෙකු පදනම් කරගෙන රු.40,174,665 ක් පාරිතෝෂික සඳහා වෙන්කර තිබුණු අතර එය ඉන් පසු වර්ෂවලදී අනුගමනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේද මෙම ප්‍රමිතයට අනුව කටයුතු කරන බවට වූ සාවද්‍ය සටහනක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එලෙස කටයුතු කර නොතිබුණු අතර, ඒ වෙනුවට සංස්ථාවේ සේවකයින් 240 කට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස වැටුප්වල එකතුවෙන් අඩක් හෙවත් රු.4,522,772 ක් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. විමසුම්වලට පිළිතුරු වශයෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන්කර ඇති බවට ප්‍රකාශ වුවද, එම පනත ප්‍රකාරවද වෙන් කළ යුතු ප්‍රමාණය රු.85,751,940 ක් විය යුතු නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානයට වෙන්කර තිබුණු ප්‍රමාණය රු.35,461,706 ක් වූයෙන් ඌන වෙන්කිරීම රු.50,290,234 ක් විය.

(උ) නෛතික ප්‍රතිපාදනවලට අනුව සංස්ථාවට නොමිලේ ලැබෙන ඖෂධ අමු ද්‍රව්‍යවලට මිල කමිටුවක් මගින් මිළක් නියම කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට 2022 අප්‍රේල් 28 දිනැති අංක 14193 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන තිබුණු අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු කංසා අගිල් හා කොතලහිඹුටු ප්‍රමාණය රු.52,744,536 කට අගය කර එය විලම්බිත අදායමක් වශයෙන්ද, 2021 වර්ෂයේ නිෂ්පාදනය සඳහා භාවිතා කළ ප්‍රමාණය රු.8,092,119කට අගය කර එය විවිධ අදායමක් වශයෙන්ද ගිණුම් ගත කර තිබුණි. එසේ වුවද, නොමිලේ ලැබෙන අමුද්‍රව්‍ය අගය කර දැක්වීම මගින් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කරන තොරතුරු වලට අහිතකර බලපෑමක් ඇති වන බව ප්‍රකාශ කරමින් උක්ත ගිණුම් නැවීම ආපසු ගැලපීමට 2023 ජුනි 16 දිනැති අංක 14420 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.

ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ විලම්භිත අදායම් ගිණුමේ ශේෂය වූ රු.52,744,536.10ක් නැවත ගිණුම් අතර ගැලපීමට කටයුතු කර තිබුණි. ඒ අනුව නොමිලයේ ලැබෙන ඖෂධ සම්බන්ධයෙන් සුදුසු හා නිශ්චිත ගිණුම්කරණ

ප්‍රතිපත්තියක් හඳුන්වා දීමට හා එය අඛණ්ඩව අනුගමනය කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි.

(ඌ) ගෙවීම් වවුචර ගිණුම්ගත කරන අවස්ථාවේදීම අදාළ වියදම නිවැරදිව වර්ගීකරණය කර ගිනුම්ගත කිරීම වෙනුවට, කාර්යාල උපකරණ හා, යන්ත්‍රෝපකරණ අමතර කොටස් වැනි වත්කම් මිලදී ගැනීම, අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය මිලදී ගැනීම, සුභ සාධන හා ගොඩනැගිලි නඩත්තු ද්‍රව්‍ය මිලදී ගැනීම යනාදිය සඳහා වර්ෂය පුරා දරන ලද රු.59,857,724ක වියදම් ලිපිද්‍රව්‍ය ගිණුමට හර කර වර්ෂ අවසානයේදී ජර්නල් සටහන් මඟින් අදාළ ගිණුම් වලට මාරු කර තිබුණි.

(එ) 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල වැරදි නිවැරදි කිරීමට, ගැලපුම් සිදු කිරීමට හා අත්තිකාරම් පියවීමට පිළියෙල කර තිබුණු එකතුව රු.2,090,700,289ක්වූ ජර්නල් වවුචර් 1438ක් වගකිවයුතු නිලධාරියකු විසින් පරීක්ෂාකර බලා අනුමත කර නොතිබුණි. තවද, පරිගණකගත කරන ලද එකතුව රු.151,744,869 ක්වූ ජර්නල් සටහන් 36ක් පසුව අවලංගු කර තිබුණද එම ජර්නල් වවුචර්ද පිළියෙල කිරීමේදී මෙන්ම අවලංගුකිරීමේදි වගකිවයුතු නිලධාරියකු විසින් අනුමත කර නොතිබුණු අතර අවලංගු කළ බවට කිසිදු සටහනක් ජර්නල් වවුචරය මත තබා නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු නිෂ්පාදන ගිණුමට අනුව නිෂ්පාදන පිරිවැය රු.726,151,032ක් වූවද, ඒකක නිෂ්පාදන පිරිවැය මත කාර්තු පදනමෙන් පිළියෙල කර තිබුණු නිෂ්පාදන පිරිවැය වාර්තා අනුව මුළු නිෂ්පාදන පිරිවැය රු.495,632,070ක් වූයෙන් වෙනස රු.230,518,961ක් විය. මෙම පිරිවැය විචලනයන් පරීක්ෂාකර අදාළ ගැලැපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය රු.825,362,289ක් ලෙස දක්වා තිබුණද එක් එක් වත්කම් කාණ්ඩයට අදාළ ප්‍රත්‍යාගණන සංචිත ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනා ගත හැකි පරිදි ගිණුම් සටහනක් මඟින් හෙලිදරව් කර නොතිබුණි.

(ඕ) 2023 අගෝස්තු 21 දිනැති මහජන බැංකුවේ ශේෂ සනාථ ලිපිය ප්‍රකාරව 2015 හා 2019 වර්ෂවල විවෘත කරන ලද ණයවර ලිපි ආන්තික ගිණුම් 03ක ශේෂ එකතුව රු.1,951,492ක් වූවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.31,245,792ක් ලෙස රු.29,294,300ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) 2013 වර්ෂයේ සිට බැංකු සැසඳුම්වල දක්වා තිබුණු රු. 224, 168 ක්ද ඇතුළුව බැංකු ගිණුම් 02 කට සෘජුවම ලැබී තිබුණු වර්ෂයකටත් වඩා පැරණි රු.2,282,675 ක් වූ මුදල් හා චෙක්පත් නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) 2008 වර්ෂයේ හා ඊට පෙර සංස්ථාවේ රසායනාගාර කටයුතු සඳහා පිළිවෙලින් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හා ආයුර්වේද පර්යේෂණ ආයතනයෙන් ලැබී තිබුණු රු.3,994,341 ක හා රු.761,274 ක පරිත්‍යාග වාර්ෂිකව ක්‍රමක්ෂය හරහා ආදායමට හඳුනා නොගෙන බාහිර දායකත්වය නමින් අතිරේඛ ප්‍රාග්ධනය සැපයීමක් ලෙස වර්ෂ 15 කටත් වැඩි කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ච) 2011/2012 සිට 2013/2014 දක්වා තක්සේරු වර්ෂවලට අදාලව වෙන්කර තිබුණු රු.12,673,956 ක්වූ අදායම් බදු 2015, 2016 සහ 2017 යන වර්ෂවල දේශීය අදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවා තිබුණු අතර එම ගෙවීම් අදායම් බදු වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට "ලාභාංශ බදු" නමින් වූ ව්‍යාජ වත්කම් ගිණුමකට හර කර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම සඳහා අදාල ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අදායම් බදු වෙන් කිරීමේ ගිණුමට එරෙහිව කපා හැරීමට කටයුතු කිරීම වෙනුවට 2017 සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව එක් එක් වර්ෂවලට අදාල අදායම් බදු ගැලපීමේ සටහන් වල දැක්වෙන අදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ ශේෂයෙන් උක්ත ව්‍යාජ වත්කම් ගිණුමේ ශේෂය අඩුකර දක්වා තිබුණි.

(ජ) ඖෂධයේ වූර්ණයට මිශ්‍ර කර පුද්ගලික වෛද්‍යවරුන් හා ඖෂධ නිෂ්පාදනාගාර වෙත අලෙවි කරන කංසා කිලෝග්‍රෑම් 01ක විකුණුම් මිල ඉකුත් වර්ෂයේ රු.20,000 ක්ද සමාලෝචිත වර්ෂයේ රු.15,000ක්ද විය යුතු බවට මිල කමිටුවක් විසින් තීරණය කර තිබුණි. ඒ අනුව විකුණන ලද කංසා ඉකුත් වර්ෂයේ කිලෝග්‍රෑම් 199.2 ක් හා සමාලෝචිත වර්ෂයේ කිලෝග්‍රෑම් 224.69 ක් පිළිවලින් රු.3,984,000ක් හා රු.3.370,350ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. නොමිලේ ලැබී තිබුණු හා සාමාන්‍ය වෙළඳපල තුළ අලෙවි නොවන තහනම් ද්‍රව්‍යක් වන කංසා සඳහා ඉකුත් වර්ෂයේ කිලෝග්‍රෑම් එකක් විකුණුම් මිල රු.20,000කට සහ සමාලෝචිත වර්ෂයේ කිලෝග්‍රෑම් එකක විකුණුම් මිල රු.15,000කට තීරණය කිරීමට යොදාගත් පදනම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

(ට) අලෙවි අංශයේ විකුණුම් වාර්තා සමඟ මූල්‍ය අංශයේ විකුණුම් වාර්තා සැසඳීමේදී, අත්පිට විකුණුම් රු.732,947 ක් සහ ණයට විකුණුම් රු.14,004,863 ක් අඩුවෙන්ද, ජංගම විකුණුම් රු.1,070.304 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම රු.13,666,506ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඩ) ගනුදෙනුවක නියමිත වටිනාකමට වඩා වැඩියෙන් ලැබීම් හෝ ගෙවීම් සිදු වූ අවස්ථාවලදී ඒවා නිවැරදි නොකිරීම හා නිවැරදිව ලැබීම් ගෙවීම් සටහන් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ගිණුම් 150 ක එකතුව රු.499,286 ක් වූ බැර ශේෂද, ණයහිමි ගිණුමක රු. 273ක හර ශේෂයක්ද ඉතිරිව තිබුණු අතර එම ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කිරීම වෙනුවට ණය ගැතියන් ගෙන් වැඩිපුර මුදල් ලැබීම් ජංගම වගකීම් යටතේද ණයහිමියන්ට වැඩිපුර ගෙවීම් ජංගම වත්කම් යටතේද ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවල හා ඖෂධ අලෙවිසැල්වල හානිවූ හා කල් ඉකුත් තොග සඳහා වෙන්කිරීම අදාළ ජර්නල් වවුචරයට අනුව රු.3,987,609 ක් වූවද එය රු.4,327,657 ක් ලෙස රු. 340,048 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ත) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව ණය ගැනි හා ණය හිමි ශේෂ පිළිවෙලින් රු.148,120,041ක් හා 149,673,262ක් වූවද එදිනට පිළියෙල කර තිබුණු ණය ගැනි හා ණය හිමි කාල විශ්ලේෂණ අනුව ශේෂ පිළිවෙලින් රු.145,290,977 ක් හා රු.149,609,612 ක් වූයෙන් වෙනස පිළිවෙලින් රු.2,829,064 ක් හා රු.63,650 ක් විය. ණය ගැතියන් හා ණය හිමියන් සඳහා පාලන ගිණුම් ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම මෙම් වෙනස්කම්වලට හේතුව වී තිබුණි. කෙසේ වුවද එම වෙනස්කම්වලට හේතු වූ කරුණු පැහැදිලි කිරීම් කිසිවක් ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි.

(ද) 2022 දෙසැම්බර් 31 දිනට රු.148,120,041 ක්වූ ණයගැනි ශේෂ 103 කින් රු.122,112,233 ක්වූ ශේෂ 13 කට අදාළ ණයගැතියන් වෙත පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.76,049,448 ක්වූ ශේෂ 64කට පිළිතුරු එවා නොතිබුණු අතර පිළිතුරු එවා තිබුණු රු.46,970,144 ක්වූ ණය ගැනි ශේෂ 19 කින් රු.4,774,576 ක්වූ ණය ගැතියන් 12 දෙනෙකු එම ශේෂ තහවුරු කර නොතිබුණි. රු.41,316,793 ක්වූ ණය ගැතියන් 05 දෙනෙකු විසින් තහවුරු කළ ශේෂය රු.25,519,958 ක් විය. ඒ අනුව රු.122,628,667 ක්වූ ණය ගැනි ශේෂ 101ක් ශේෂ සනාථන මගින් තහවුරු වී නොතිබුණි.

(න) 2022 දෙසැම්බර් 31 දිනට රු.149,673,300 ක්වූ ණයහිමි ශේෂ 116 කින් රු.117,875,459 ක්වූ ශේෂ 61කට පමණක් ශේෂ සනාථන ලිපි යවා තිබුණි. ඉන් රු.85,943,210 ක්වූ ශේෂ 51ට පිළිතුරු එවා නොතිබුණු අතර පිළිතුරු එවා තිබුණු රු.31,932,249 ක ණයහිමි ශේෂ 10කින් රු.262,098 ක් වූ ණයහිමියන් 02 දෙනෙකු තහවුරු කළ ශේෂය රු.103,188 ක්වූ අතර රු.426,750 ක්වූ ණයහිමියකු තහවුරු කළ ශේෂය රු.436,500 ක් විය. ඒ අනුව රු.118,360,209 ක්වූ ණයහිමි ශේෂ 112 ක් ශේෂ සනාථන මගින් තහවුරු වී නොතිබුණි.

(ප) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සේවක ඇප රු.267,815 ක් වුවද, සේවක ඇප කේවල ශේෂ ලැයිස්තුව අනුව සංස්ථාවේ සේවකයන් 68 දෙනෙකුගේ නිදහස් නොකල ඇප වටිනාකම රු.851,215 ක් වූයෙන් රු.583,400 ක්වූ වෙනසක් පැවතුණි.

(බ) සාමාන්‍ය වියදම් අත්තිකාරම් රු.5,006,437 කට හා ණයවර ලිපි වලට අදාල සියයට 10 ක රැඳවුම් මුදල් රු.1,894,902 කට අදාළ උපලේඛන, ටෙන්ඩර් ආරක්ෂිත තැන්පතු රු.15,076,310 කට හා ගෙවිය යුතු තැන්පතු රු.1,003,187 කට අදාළ උපලේඛන, තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ, වර්ෂ 15 ක සිට නොවෙනස්ව පවතින රු.1,923,741 ක්වූ ප්‍රාග්ධන සංචිත ශේෂය තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි, 2008 වර්ෂයේ හා ඊට පෙර සංස්ථාවේ රසායනාගාර කටයුතු සඳහා පිළිවෙලින් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් හා ආයුර්වේද පර්යේෂණ ආයතනයෙන් ලැබී තිබුණු රු.3,994,341 ක හා රු.761,274 ක පරිත්‍යාග යනාදිය තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි ඇතුළත් ලිපිගොණු හා රු.636,000,000 ක ඉඩම්වලට අදාළව අයිතිය තහවුරු කරන ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආඥාඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දැක්වෙන (අ)(ii), (ආ), (ඉ) (ii), (ඊ), (උ), (ඌ),(ඒ), (ඔ), (ඕ), (ජ), (ට), (ඩ), (ත), (ද), (න), (ම), (ය), (ර) සහ (ව) යන නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති / විධිවිධානයට යොමුව	විස්තරය
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත	
(i) 18(4) වගන්තිය	පනතේ 18(2) වගන්තිය අනුව තීරණය කරන ලද විගණන ගාස්තු අදාළ ආයතනය විසින් ඉන්වොයිසියේ සඳහන් දිනයේ සිට දින 30 ක් ඇතුළත නිරවුල් කළයුතු වුවත් එකී විධිවිධාන ප්‍රකාරව 2019 සිට 2021 වර්ෂය දක්වා එකතුව රු.4,836,000 ක්වූ විගණන ගාස්තු 2023 සැප්තැම්බර් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.
(ii) 38(I)(ඉ) වගන්තිය	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාළ සීමාවන් තුළ සියලු විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ගණන් දීමේ නිලධාරි සහතික විය යුතුය. එසේ වුවද 2019, 2020, 2021 හා 2022 යන ගිණුම් වර්ෂවලට අදාළ එකතුව රු.4,472,432,062 ක්වූ වටිනාකම් සම්බන්ධයෙන් නිකුත් කළ විගණන විමසුම් 24 ක් සඳහා 2023 ඔක්තෝබර් 30 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.
(iii) 39(1) හා 39(2) වගන්ති	1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන විස්තරාත්මක විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් එම වාර්තාවේ දින සිට මාස 03ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකි වීමේ හේතු තිබේ නම් ඒ බව විගණකාධිපතිවරයා වෙතද, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයා වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු වුවද, එකී විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂයේ සහ 2021 වර්ෂයේ විස්තරාත්මක විගණකාධිපති වාර්තා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග 2023 සැප්තැම්බර් 30 දින දක්වා ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i)	මුදල් රෙගුලාසි 08	සංස්ථාවේ ආදායම් ඇස්තමේන්තුව හා වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරීමේදී ආදායම් විෂයයන්, පුනරාවර්තන වැය විෂයයන් හා ප්‍රාග්ධන වැය විෂයයන්ට අදාලව අයවැය වර්ගීකරණ ඒකකයන් සඳහා වූ ප්‍රමිතිකරණය කරනු ලැබ ඇති ආදායම් හා වැය විෂයයවල සම්මත සංකේත සහ කාර්යය විස්තරයන් අනුගමනය කර නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 103, 104 සහ 105	❖ මුළු පිරිවැය රු.12,885,943 ක් වූ කල් ඉකුත් වූ හා භාවිතයට ගත නොහැකි තොග සහ මුළු පිරිවැය රු.9,459,348 ක් වූ තොග ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ❖ අලෙවි මධ්‍යස්ථාන හා ගබඩා 8 ක 2019 වර්ෂයට අදාළ එකතුව රු.2,178,305 ක් වූ ඌනතා සහ රු.1,484,545 ක් වූ අතිරික්තතා සම්බන්ධයෙන් 2021 නොවැම්බර් 01 දිනැති අංක 14,026 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙන තිබුණු තීරණ අනුව කටයුතු කර නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 110	හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණු නමුත් එය මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර එය යාවත්කාලීනද කර නොතිබුණි.
(iv)	මුදල් රෙගුලාසි 156 (1) (ඇ) හා (ආ)	2019 දෙසැම්බර් 31 දිනට වාර්ෂික තොග සමීක්ෂණය අනුව හඳුනාගත් අංක 01/02 ගබඩාවේ 2012 ත් 2014 ත් කාලපරිච්ඡේදයේ මිල දී ගෙන ඇති මුද්දරප්පලම් තොග ඌනතාවය රු.2,876,893ක් සහ අංක 10 ලේබල් ගබඩාවේ පසුගිය වර්ෂවල මුද්‍රණය කළ නමුත් ප්‍රයෝජනයට නොගත් ලේබල් තොග ඌනතාවය රු.461,310 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(v)	මුදල් රෙගුලාසි 166	මුදල් සමඟ ලැබෙන අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම සහ විධිමත් සටහන් තබා නොගැනීම හේතුවෙන් හඳුනාගැනීමට නොහැකි වූ වර්ෂ 10 කට වඩා පැරණි ලැබීම් රු.224.168 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi)	මුදල් රෙගුලාසි 185	සරප්ගේ දිනපතා ගනුදෙනු සටහන් කිරීම සඳහා මුදල් පොතක් එකි විධිවිධාන ප්‍රකාරව පවත්වාගෙනු ගොස් නොතිබුණි. තවද දිනපතා ගනුදෙනු අවසානයේ හරි වැරදි බැලීම සඳහා වගකිවයුතු නිලධාරීයකුද පත්කර නොතිබුණු අතර සරප් කවුන්ටරය විවෘත කර තබන සහ වසාතබන නිශ්චිත වේලාවක් තීරණය කර නොතිබුණි.
(vii)	මුදල් රෙගුලාසි 371 (2) හා (5)	තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගත් මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය නිමකළ විගසම හෝ කාර්ය නිමකර දින 10ක් තුළ අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරීන් 09 දෙනෙකු ලබා ගෙන තිබුණු එකතුව රු.579,900 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම 21ක් ආපසු පියවීම සඳහා කාර්ය නිම කර දින 10 ඉක්මවා දින 05 සිට දින 134ක් අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. තවද, අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර අග්‍රිමය ආපසු හාරදීම සිදු කළ යුතු වුවද, නිලධාරීන් 10 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුළදී ලබා ගෙන තිබුණු එකතුව රු.169,408 ක තත්කාර්ය අතුරු අග්‍රිම සහ සුළු මුදල් හාරකරුවන් 12 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.76,530 ක සුළු මුදල් අත්තිකාරම් 2022 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි.
(viii)	මුදල් රෙගුලාසි 372	ආයතන ප්‍රධානියා හෝ ඒ සඳහා බලය දෙන ලැබූ අන්‍යනිලධාරියකු විසින් නියමිත කාල සීමාවක් අනුව අග්‍රිම හා අතුරු අග්‍රිම නිරතුරුවම පරීක්ෂා කර බැලිය යුතු වුවත් එකි විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.
(ix)	මුදල් රෙගුලාසි 486	බැංකු ගිණුම් 02 ක නැන්පත් කර තිබුණු නමුත් උපලබ්ධිවී නොතිබුණු රු.201,434 ක් වටිනා වර්ෂයකටත් වඩා පැරණි වෙක්පත් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(x)	මුදල් රෙගුලාසි 756 (6) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11 ඡේදය	සමාලෝචිත වර්ෂයේ තොග සමීක්ෂණ වාර්තා අනුව අලෙවි සැල් 13 ක රු.1,223,002 ක්වූ නිමි තොග ඒකක 9,966ක ඌනතාවයක් හා රු. 251,821 ක්වූ නිමි තොග ඒකක 813 ක අතිරික්තයක්ද අමුද්‍රව්‍ය ගබඩා 06 ක හා අංක 10, 24, 8 13 ගබඩාවල රු.8,236,346 ක්වූ තොග ඒකක 60,433 ක ඌනතාවයක් ද රු.4,784.698 ක් වූ තොග ඒකක 89,253 ක අතිරික්තයක්ද පැවැති නමුත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(xi)	මුදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 09 ඡේදය	රජයේ ගිණුමට අදාල වවුචර සහතික කරන චෙක්පත් අත්සන් කරන නිලධාරීන්ද ඇප තැබිය යුතු වූවත්, එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(xii)	මුදල් රෙගුලාසි 1645(අ)	විධිවිධාන ප්‍රකාරව සෑම වාහනයක් සම්බන්ධයෙන්ම පොදු 267 ආකෘතිය අනුව යාවත්කාලීනව වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි.
(xiii)	මුදල් රෙගුලාසි 1646	වාහන භාර නිලධාරීන් විසින් වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊලඟ මාසයේ 15 වැනි දිනට පෙර ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත් සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙත යැවිය යුතු වූවත්, සංස්ථාව සතු කිසිදු වාහනයක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 (අ), (ඇ) සහ (ඇ) ඡේද	සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නිබුණු ක්‍රියාකාරී සැලැස්මට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත හා දැනට සිටින කාර්ය මණ්ඩලය, අයවැය ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, කාල රාමුව හා අපේක්ෂිත නිමවුම ඇතුළත් කර නොතිබුණි.

(ඇ)	1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	චක්‍රලේඛ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදන දිරි දීමනා රු.20,917,337 ක්, පැමිණීමේ දීමනා රු.9,897,950 ක්, ඵලදායිතා දීමනා රු.34,114,768 ක් ද, වශයෙන් එකතුව රු.64,930,055 ක් ද, ඇතුළුව පසුගිය වර්ෂ 08කදී රු.611,071,569 ක් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව දිරි දීමනා වශයෙන් ගෙවා තිබුණි.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය අනුව හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6.6 ඡේදය	යම් මුදල් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත රාජ්‍ය සංස්ථා වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කොටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කොටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට දින 192 ක් ගතවී තිබුණි.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ	අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්ද, සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් ද පිළියෙල කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2022 වර්ෂයේ මාස 09ක නිෂ්පාදනයට අවශ්‍ය වියළි හා රස ඖෂධ වර්ග 76කින් කිලෝග්‍රෑම් 91,775ක් සහ මාස 06 ක නිෂ්පාදනයට අවශ්‍ය තෙල් හා දියර වර්ග 06කින් කිලෝග්‍රෑම් 107,287ක් ආනයනය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 (ආ) මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු මිලෙන් ප්‍රතිශතයක් සඳහන් කරමින් පමණක් ලංසු සුරක්ෂණ තැන්පතු ඉල්ලා සිටීම තදින්ම අධෛර්යමත් කළයුතු වුවත්, යථොක්ත ප්‍රසම්පාදනයේදී ලංසු ලේඛනවල උපදෙස් අනුව මුළු ලංසු මිලෙන් සියයට 5ක ලංසු සුරක්ෂණ තැබිය යුතු බවට දැක්වීම මගින් උක්ත ඖෂධ වර්ග 82 න් කොටසක් හෝ සාපේක්ෂ අඩුමිලට සැපයීමට ඉදිරිපත් විය හැකිව තිබුණු සුළු පරිමාණ සැපයුම් කරුවන්ට ප්‍රසම්පාදනය සඳහා සහභාගී වීමට තිබුණු අවස්ථාව වලක්වා තිබුණි.

(ii) ප්‍රසම්පාදන දැන්වීම මගින් විදේශීය සැපයුම්කරුවන් නිෂ්පාදකයන් හෝ ඔවුන්ගේ බලය පැවරූ දේශීය නියෝජිතයන් වෙතින් මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවා තිබුණද, ඊට පටහැනිව හා ලංසු සුරක්ෂණද රහිතව දේශීය ආයතනයක මිළ ගණන් පිළිගෙන තිබුණි. සම්මත ලංසු ලේඛන වල විදේශීය සැපයුම්කරුවන් CIF මිලට ඇ.ඒ.ඩොලර් වලිනුත් දේශීය සැපයුම්කරුවන් සංස්ථාව දක්වා සැපයීමේ මිලට ශ්‍රී ලංකා රුපියල් (LKR) වලිනුත් මිල ගණන් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද යථොක්ත දේශීය ආයතනය සංස්ථාව දක්වා සැපයීමට ඇ.ඒ.ඩොලර් වලින් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. ලංසු කැඳවීමේ ලේඛන වල නිශ්චය කොට ඇති කරුණු වලට පරිභාහිර බැවින් එම ලංසුව ප්‍රතික්ෂේප කල යුතු වුවත් තාර්කික පදනමකින් හා විනිවිදභාවයකින් තොරව සිදු කළ ඇගයීම් ක්‍රියාවලියක් හරහා ඇ.ඒ.ඩොලර් 329,125.3 ක වියළි ඖෂධ හා තෙල් හා දියර වර්ග 36ක කිලෝ ග්‍රෑම් 35,157.5 ක් ආනයනය කිරීමට එම ආයතනයට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සහතික විය යුතු ඇගයීමේ හා තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටියෙහි විනිවිදභාවය සහ නිත්‍යභාවය තහවුරු කිරීම සිදු වී නොතිබුණ බවත්, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව යථොක්ත දේශීය ආයතනය සම්බන්ධයෙන් විශේෂ ඇල්මකින් කටයුතු කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) ආසියානු රටවල පවතින සම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම ඒකාබද්ධ කරමින් දේශීය ජනතාවට මෙන්ම විදේශිකයන්ට ස්වකැමැත්තෙන් ප්‍රතිකාර සහ ඖෂධ ලබා ගැනීමට හැකි අන්තර්ජාතික වෛද්‍ය කලාපයක් ඇතිකිරීම සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන කටයුතු පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මිල ගණන් කැඳවීමේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උපදේශකයන් තෝරා ගැනීම හා සේවයේ යෙදවීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදනයට යොමුවීමේ කොන්දේසි (Terms of Reference) (TOR) පිළියෙල කර නොතිබුණි. තවද 3.14.3 මාර්ගෝපදේශය ප්‍රකාරව උපදේශන සේවාවල මුළු පිරිවැය රු.මිලියන 10 ක් නොඉක්ම වන්නේ නම් රාජ්‍ය ආයතන සඳහා උපදේශන සේවාව ප්‍රදානය කිරීමට හැකියාව තිබියදීත් සභාපති විසින් ප්‍රසම්පාදන මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව වාස්තු විද්‍යාඥ කටයුතු වල නියුතු පුද්ගලයකු වෙත මුළු ඉදිකිරීමේ පිරිවැයෙන් සියයට 5ක් ගෙවීමට යටත්ව කොන්ත්‍රාන්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) කිසියම් ලංසුවක වලංගු හා ප්‍රතිවාරාත්මකභාවය පිළිගනු ලැබීමට අවශ්‍ය වන්නා වූ කොන්දේසි ලංසු කැඳවීමේ ලේඛනවල පැහැදිලිව නිශ්චය කිරීමට තාක්ෂණික හා මූල්‍ය යෝජනා සඳහා සම්මත ලේඛන ලබා දිය යුතු නමුත් උපදේශන සේවා සපයන ආයතන 11ක් වෙත මිල ගණන් කැඳවීමේ දැන්වීම පමණක් යොමු කර මිල ගණන් කැඳවා තිබුණි. ඒ අනුව උපදේශක ආයතන 04ක් ලංසු ඉදිරිපත් කර තිබුණු අතර උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2 මාර්ගෝපදේශය ප්‍රකාරව දිනුම් ලංසුව තෝරා ගැනීම සඳහා සාධාරණ උපමානයන් සහ ක්‍රමවේදයන් විහව ලංසු කරුවන් වෙත සංනිවේදනය කිරීමට කටයුතු නොකර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තම අභිමතය

පරිදි තීරණ කළ ලංසු ඇගයීමේ උපමානයන් 05ක් අනුව ලංසු ඇගයීම කර තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සහතික වියයුතු ඇගයීමේ සහ තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය සහ නිත්‍යභාවය සහතික වී නොතිබුණි.

(iii) රු. මිලියන 100 ක් වූ මුළු ව්‍යාපෘති පිරිවැයෙන් රු.මිලියන 40ක් භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින්ද රු.මිලියන 60ක් සංස්ථාව මගින්ද දැරීමට යෝජනා කර තිබුණද, ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය හා ප්‍රතිපාදන ලබා දී නොතිබුණු අතර සංස්ථා දායකත්වය සඳහාද මුදල් වෙන්කර නොතිබුණි. එසේ වුවද 2023 සැප්තැම්බර් 30 දින වන විටත් වැඩ ආරම්භ කිරීමට කිසිදු සූදානමක් නොතිබුණු මෙම ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් හෝ පිළියෙල නොකර රජයේ උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව අවිධිමත්ව සේවයේ යොදවාගත් සැලසුම් ශිල්පියකුට රු.මිලියන 02 ක් ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) සංස්ථාවේ නිෂ්පාදිත ආයුර්වේද ඖෂධ බෙදා හැරීම හා ප්‍රධාන නගරවල ඖෂධ අලෙවිසැල් පවත්වාගෙන යාම සඳහා අලෙවි නියෝජිතයින් පත්කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාතික වශයෙන් ප්‍රචාරය කළ යුතු මෙම ප්‍රසම්පාදනයට අදාළ දැන්වීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (අ) මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීම වෙනුවට අදාළ ඉල්ලුම්පත් කැඳවීම සංස්ථා වෙබ් අඩවියේ සහ ෆේස්බුක් ගිණුමේ දැන්වීම් පල කිරීම මගින් පමණක් සිදු කරතිබුණි.

(ii) 2022 ජූලි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 14226 ප්‍රකාරව අලෙවි නියෝජිතයන් විසින් රු.700,000ක බැංකු ඇපකරයක් සහ රු.300,000ක ණය රක්ෂිත අරමුදලක් ජංගම ගිණුමක තැන්පත් කළ යුතු වුවද සංස්ථාව එම විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී නියෝජිතයින් 15 දෙනෙකුට නියෝජිතභාවය පිරිනමා තිබුණි.

(iii) රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සඳහා විකුණුම් මිලට එකතු කරන ලද වට්ටම් සීමාවද ඉක්මවා පෞද්ගලික අංශයේ අලෙවි නියෝජිතයින්ට රු.500,000කට වැඩි මිලදී ගැනීම් සඳහා සියයට 33 සිට සියයට 40ක් දක්වා වට්ටම් ලබා දීම නිසා සියයට 25ක් වූ සංස්ථාවේ ලාභ ආන්තිකයෙන් සියයට 03ක්, සියයට 05ක්, සියයට 07ක් හෝ සියයට 10ක් ආදී වශයෙන් සියයට 15ක් දක්වා අඩුකර ගෙන තිබුණි. ඒ අනුව සාමාන්‍ය පාරිභෝගික ජනතාවට ලබා දිය හැකිව තිබුණු මිල සහනයක් පෞද්ගලික අලෙවි නියෝජිතයින් වෙත ලබා දීමටත් රාජ්‍ය ආයතනවලට එම අවස්ථාව ලබා නොදීමටත් සංස්ථාව කටයුතු කර තිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශයට පටහැනිව ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රමිතිය නොසලකා හැරීම හා ප්‍රමිතිය සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම මගින් ඇතැම් සැපයුම්කරුවන්ට වාසිදායක වන ආකාරයට ප්‍රසම්පාදන කටයුතු කර තිබුණු අවස්ථා පැවැති බව නිරීක්ෂණය විය.

(i) පිළිගත් ආයතනයක් වෙත යොමුකර ප්‍රමිතිය සම්බන්ධයෙන්වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස රු.2,840,000ක්වූ රසදිය (අශුද්ධ) කිලෝග්‍රෑම්100ක් මිලදී ගෙන තිබුණි.

(ii) රසායනාගාර පරීක්ෂණ වාර්තා අනුව ප්‍රමිතියෙන් බැහැර බවට තීරණය වීමෙන් පසුව සංස්ථාවේ ආයුර්වේද වෛද්‍යවරයකුගේ නිර්දේශයක් ලබාගෙන සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු යන මාස වල රු.1,462,500 කට මී පැණි කිලෝග්‍රෑම් 1500ක්, රු.3,784,500කට තල තෙල් කිලෝග්‍රෑම් 15,036ක් හා රු.2,810,475කට මී තෙල් කිලෝග්‍රෑම් 3,507ක් මිලදී ගෙන තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06කදී දඹාන ආදිවාසී ගම්මාන සහ මහියංගණය අවට ප්‍රදේශ වලට ගොස් ප්‍රසම්පාදන කටයුතු වලින් බැහැරව වියළි ඖෂධ මිලදී ගැනීම සඳහා එකතුව රු.6,000,000 ක අත්තිකාරම් ලබා දී තිබුණි. ඒ අනුව ලිඛිත ඉල්ලීම් සහ වියදම් ඇස්තමේන්තු නොමැතිව වරකට 5ත් 12ත් අතර නිලධාරීන් සංඛ්‍යාවකට රු.100,000 බැගින් අත්තිකාරම් වවුචර පිළියෙල කර, එම වවුචරවලට අදාළ සියලු අත්තිකාරම් මුදල් සහකාර අතට ලබා ගෙන, සභාපති ඇතුළු නිලධාරීන් කිහිප දෙනෙකු සමඟ ගොස් දඹාන ආදිවාසීන්ගෙන්ද එම ප්‍රදේශයේ වෙනත් සැපයුම් කරුවෙකුගෙන්ද අත්පිට මුදලට මිලදී ගැනීම් සිදු කර තිබුණි. තවද එක් එක් කළමනාකරුවන් වෙන වෙනම අත්තිකාරම් පියවීමට කටයුතු නොකර එක් ජර්නල් වවුචරයකින් වගකිවයුතු නිලධාරියකුගේ අනුමැතියක්ද නොමැතිව අදාළ අත්තිකාරම් පියවා තිබුණි.

3. වෙනත් කරුණු

(අ) ගබඩා තුළ ක්‍රමවත් ලෙස තොග ගබඩාකර නොතිබුණු අතර උපරිම, අවම හා යලි ඇණවුම් හා ආර්ථික තොග මට්ටම් පවත්වා නොතිබුණු බවත්, බින් කාඩ් හා තොග ලෙජර විධිමත්ව භාවිතා කර නොතිබුණු බවත්, සෙමින් වලනය වන තොග පැවති නමුත් එම අයිතම හඳුනාගෙන අලෙවි ප්‍රවර්ධන උපක්‍රම භාවිතා කර නොතිබුණු බවත්, ඖෂධවල මිල වැඩිවීම, ලේබල් හා ඇසුරුම් බොඳවීම ආදී වූ හේතූන් මත අලෙවියෙන් ඉවත් කර තිබුණු ඖෂධ වර්ග කල් ඉකුත් වූ ඖෂධ සමඟ එකට ගබඩාකර තිබුණු බවත්, එම තොග නැවත ලේබල් කර අලෙවි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන කල් ඉකුත් වීමට ඉඩ හැර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල හා ගබඩාවල පවතින කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග දීර්ඝ කාලයක සිට තොග පොත්වලින් ඉවත් නොකර සාමාන්‍ය තොග ලෙස ගණනය කර තිබුණු බවත්, අලෙවි මධ්‍යස්ථානවල පැවැති කල් ඉකුත් වූ ප්‍රයෝජනයට ගත නොහැකි ඖෂධ වර්ග මධ්‍යම ගබඩාවලට ප්‍රවාහනය නොකිරීම නිසා අක්‍රමිකතාවයන්

සිදුවීමට ඉඩකඩ පැවැති බවත්, අලෙවි මධ්‍යස්ථානවල විශාල ඉඩ ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවති බවත්, නිරීක්ෂණය විය.

(ආ) නිෂ්පාදිත ඖෂධ වර්ගය මත බර තැබීමක් කරමින් අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන කටයුතු සඳහා සෘජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට හැකි වන නමුත් එවැනි ක්‍රමයක් වෙනුවට රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 07 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු.52,781,881ක් ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.64,930,055 ක් දක්වා සියයට 23 කින් වැඩිවී තිබුණු අතර නිෂ්පාදන පිරිවැය ඉහළ යන අවස්ථාවලදී සංස්ථාවේ ලාභදායිත්වය අඩු වුවද ගෙවන නිෂ්පාදන දිරි දීමනාව වැඩි කිරීමට සිදුව තිබුණි.

(ඇ) 2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.75,500,000 කින් රු.30,921,906 ක් හෙවත් සියයට 41ක් 2023 ජුනි 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.

(ඈ) රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු.37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2018 අගෝස්තු 25 දින ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2023 සැප්තැම්බර් 30 වන විට වසර 05 ක් ඉක්මවා තිබුණු නමුත් අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණි. ඒ අනුව එම ව්‍යාපෘතිය වෙනුවෙන් එතෙක් කළ වියදම අනාර්ථික බවට පත්ව තිබුණු අතර කොන්ත්‍රාත්තුවේ පිරිවැය රු.58,940,280 ක් දක්වා රු.25,431,163 කින් එනම් සියයට 75.89 කින් ඉහල ගොස් තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, අරිෂ්ඨ , ආසව, තෙල්, ක්වාත, සිරප් ඇතුළු ඖෂධීය දියර වර්ගයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය ලීටර. 627,712 ක් හා චූර්ණ, ගුගුල්, කල්ක, ලේප, ලේහ, මෝදක, රස, වටී ඇතුළු ඖෂධීය ද්‍රව්‍යයන්ගෙන් සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම්. 151,179 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, තත්‍ය නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 389,750 ක් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 70,799 ක් විය. ඒ අනුව අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් දියර වර්ගයන්ගෙන් ලීටර. 237,962 ක් එනම් සියයට 38 කින් හා ද්‍රව්‍ය කිලෝග්‍රෑම්. 80,380 කින් එනම් සියයට 53 කින් ළඟාකර ගැනීමට නොහැකිවී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 2135 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 1441 ක් වූයෙන් වැඩපත් 694 ක ප්‍රමාණයක් එනම් සියයට 33 ක්, ප්‍රධාන නිෂ්පාදනාගාරයේ නව නිෂ්පාදන 04 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 215 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 127 ක් වූයෙන් වැඩපත් 88 ක ප්‍රමාණයක් එනම් සියයට 41 ක් හා නව නිෂ්පාදනාගාරයේ

නව නිෂ්පාදන 12 ක් සඳහා නිෂ්පාදන වැඩපත් 1228 ක් සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය වැඩපත් ප්‍රමාණය 423 ක් වූයෙන් වැඩපත් 805 ක ප්‍රමාණයක් එනම් සියයට 66 ක් නිමකර ගැනීමට නොහැකිවී තිබීම අපේක්ෂිත නිෂ්පාදන ඉලක්ක කරා ළඟා නොවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඊ) සංස්ථාව විසින් අවස්ථා 111 කදී රු. 823,790 ක් වටිනා ඖෂධ නොමිලේ නිකුත් කර ඒවායේ පිරිවැය රු. 605,599,45 ක් පරිත්‍යාග ලෙස විකුණුම් හා බෙදා හැරීම් වියදම් යටතේ දක්වා තිබුණි. තවද 2019 ජූලි 08 දිනැති අංක 13406 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව විෂය භාර අමාත්‍යවරයාගේ ඉල්ලීමකට හැර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගත් රු.10,000කට වැඩි පරිත්‍යාග වලට අදාළ මුදල් අදාළ නිලධාරීන්ගෙන් අය කළ යුතු වුවද, ඉකුත් වර්ෂයේ අවස්ථා 14 කදී එම තීරණයෙන් බැහැරව සිදු කර තිබුණු රු.10,000 ක් ඉක්මවූ රු.681,680 ක පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156(i) ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ඌ) 2018 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවා ගණ 09ක් යටතේ සංස්ථාව සඳහා සංශෝධිත බදවා ගැනීමේ පටිපාටියක් අනුමත කර තිබුණු නමුත් එම සේවා ගණ යටතට අයත් තනතුරු වලට බඳවා ගන්නා ලද සියළුම නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමකින් තොරව සේවයේ ස්ථිර කර තිබුණි. තවද, සේවයේ ස්ථිර කිරීමේදී තෙවන පාර්ශව හරහා සුදුසුකම් සනාථ කර ගැනීමට හා සේවය ස්ථිර කල බවට පෞද්ගලික ලිපිගොනුවට පිටපතක් සහිතව ලිපියක් නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ විකුණුම් අදායම් ඇස්තමේන්තුව රු.970,000,000 ක්වූ අතර තථ්‍ය ආදායම රු.935,892,860 ක් විය. ඉන් රු.681,103,129 ක් හෙවත් සියයට 73 ක්ම රාජ්‍ය අංශයෙන් ලැබී තිබුණු අතර පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණු ආදායම රු.254,789,731 ක් හෙවත් සියයට 27 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.305,000,000 ක්වූ පෞද්ගලික අංශයේ ඇස්තමේන්තුවෙන් රු.49,809,990 ක් හෙවත් සියයට 16 ක ආදායම් ඉලක්කයක් ලභා කර ගැනීමට අපොහොසත් වී තිබුණි. නිරායාසයෙන් ලැබෙන රාජ්‍ය අංශයේ ඉල්ලුම කෙරෙහි ඇති වැඩි නැඹුරු වීමත්, වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම සහ ප්‍රමාණවත් නොවීමත්, පෞද්ගලික අංශයේ විකුණුම් ආදායම අඩුවීමට හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඒ) සංස්ථාව විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරහකාරී ආයතන අතර සංස්ථාවේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබෙද යන්න පිළිබඳ අවබෝධයක් නොතිබුණි.

(ඔ) 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පටටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 11ක පුනරාවර්තන වියදම් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 23 සිට සියයට 161 දක්වා පරාසයක විහිදී තිබුණි. තවද ප්‍රාග්ධන වැය විෂයයක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය ඉක්මවා තත්‍ය වියදම් දරා තිබුණු අතර එය සියයට 61ක් වී තිබුණි. නව ශාකසාර නිෂ්පාදනාගාරයට අදාළව අයවැය ප්‍රතිපාදනය රු.250,000ක්ව තිබියදී තත්‍ය වියදම් රු.4,071,312 ක් වීමෙන් එම ප්‍රතිපාදනය නිසිපරිදි තාත්විකව හා විචක්ෂණශීලව සමාලෝචනය නොකර ඇස්තමේතුකර තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛණය ඵලදායී මූල්‍ය පාලනකාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ක) ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් රුපියල් මිලියන 216.39 ක හා රුපියල් මිලියන 273.1 1 ක මෙහෙයුම් ආදායමක් ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 236.54 ක් හා රුපියල් මිලියන 288.45ක අයහාර වියදමක් දරා තිබුණු අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉකුත් වර්ෂයේ රුපියල් මිලියන 20.15 ක හා සමාලෝචිත වර්ෂයේ රුපියල් මිලියන 15.34 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබුණි. තවද ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම රුපියල් මිලියන 51.91 කින් එනම් සියයට 22 කින් ඉහළ ගොස් තිබුණි. මේ හේතුවෙන් ආයතනයේ තිරසාර බව සහතික කිරීම සඳහා නිසි මූල්‍ය විනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ග) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන සහිත රුපියල් මිලියන 200 ක්වූ ප්‍රාග්ධන ක්‍රියාකාරම් 10ක් පමණක් ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සැලැස්ම යටතේ ඇතුළත් කර තිබුණු නමුත් යථොක්ත ප්‍රාග්ධන ක්‍රියාකාරකම් කිසිවක් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද සංස්ථාවේ අරමුදලින් ඉටුකර තිබූ රුපියල් මිලියන 63.20 ක ප්‍රාග්ධන ක්‍රියාකාරකම් හා දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ආමාත්‍යාංශය මඟින් නිකවැරටිය හා අඹන්පොළ ඔසු උයන්වල සංවර්ධන කටයුතු වෙනුවෙන් ලබාදී තිබූ රුපියල් මිලියන 2.0 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද, සැලසුම් කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති 36 කින් 19 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු නමුත් ඉන් 17ක එනම් සියයට 47 ක භෞතික ප්‍රගතියක් ලභා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ච) 2017/2018 තක්සේරු වර්ෂයට අදාල රු.17,760,252 ක්වූ ආදායම් බදු ගෙවීම සංස්ථාව විසින් පැහැර හැර ඇති බැවින් 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ 177(1) වගන්තිය ප්‍රකාරව රු.8,792,313 ක දඩයක් සහිතව අදාල බද්ද දින 30ක් ඇතුළත ගෙවන ලෙස 2022 ජුනි 10 දිනැති ලිපිය මගින් දේශීය අදායම්

කොමසාරිස් ජනරාල් සංස්ථාවට දන්වා තිබුණි. නමුත් සංස්ථාව විසින් එකී තක්සේරු වර්ෂයට රු.17,760,252 ක්වූ ආදායම් බදු ගෙවා ඇති බැවින් එම දඩය සමඟ එකඟ විය නොහැකි බව 2022 ජූලි 07 දින දන්වා යවා තිබුණද ඒ සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණි බවට කිසිදු ලිඛිත සාක්ෂියක් නොතිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය තුලදී වර්ෂ 05කටත් පෙර සිට හිඟව පැවති රු.2,516,204 ක්වූ ණය ගැනි ශේෂ 21 ක් පදනම් කර ගනිමින් එම ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් අඩමාන ණය සඳහා වෙන් කර තිබුණු නමුත් එම ණය ගැතිගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ට) 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලසුම් අනුව වාර්ෂික විනෝද චාරිකාව සඳහා රු.1,800,000 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2020 හා 2021 වර්ෂවල ප්‍රතිපාදනද ඉතිරිව පවතින බවට වූ සාවද්‍ය කරුණු දැක්වීමක් මත පදනම්ව, 2022 පෙබරවාරි 10 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ අංක 14143 මඟින් 2022 වාර්ෂික විනෝද චාරිකාවට රු.4,500,000 ක වියදම් දැරීමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් 2021 වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් රු.20,152,134 ක අලාභයක් හා රු.17,728,950 ක ශුද්ධ අලාභයක් ලබා තිබියදී රාජ්‍ය වියදම් පාලනය පිළිබඳව මනා අධීක්ෂණයක් හා සංයමයක් පවත්වාගත යුතු වුවද එම චාරිකාව සඳහා සලසා තිබූ ප්‍රතිපාදන සීමාවද සියයට 147 ක් ඉක්මවා රු.4,442,861 ක් සංස්ථාවේ අරමුදල් වලින් වැය කිරීමේදී එහි අයහපත් බලපෑම පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණි. තවද මේ වෙනුවෙන් වැයකිරීම් සඳහා සංස්ථාවට ඖෂධ, භාණ්ඩ හා සේවා සපයන සැපයුම්කරුවන්ගෙන් මුදල් හා ද්‍රව්‍යාධාර ලබා පත් ලත් බවට සාක්ෂි අනුව තහවුරු වූ නමුත් එම මුදල් කිසිවක් විනෝද චාරිකාවට වැයකළ බව හෝ අක්‍රමිකතාවයක් හා වංචාවක් සිදු නොවූ බව හෝ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඩ) 2020 වර්ෂයේදී නව ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් සපයා සවිකර ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු.මිලියන. 5.00 ක් ලබාදී තිබුණද, 2023 අගෝස්තු 23 වන විටත් එම කාර්යය සඳහා මුදල් උපයෝජනය කර නොතිබුණි.

(ණ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2022 දෙසැම්බර් මස 31වන දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	සටහන	31.12.2022 රු. ශත.	31.12.2021 රු. ශත.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	04	1,139,137,832.00	1,074,320,574.20
සිදු කෙරෙමින් පවත්නා කටයුතු	05	16,436,520.57	12,144,409.71
කාර්ය මණ්ඩල ණය	06	15,954,838.05	15,340,656.57
විලම්බිත බදුකරණය		1,804,601.00	1,804,601.00
අනුරාධපුර ගොඩනැගිල්ල වසර 5 ගිවිසුම	07	-	-
		1,173,333,791.62	1,103,610,241.48
ජංගම වත්කම්			
තොග	08	348,065,755.02	260,290,017.51
කාර්ය මණ්ඩල ණය	06	17,458,468.11	12,600,406.01
රන් තොග		5,561,695.00	15,400,257.40
ආන්තික ගිණුම		31,245,791.93	19,310,110.51
විවිධ තැන්පතු	09	3,321,765.00	3,247,740.00
ස්ථාවර තැන්පතුවල කෙටි කාලීන ආයෝජන	10	112,131,811.08	177,860,171.58
වෙළඳ ණයකරුවන්	11	145,603,836.12	109,665,691.16
වෙළඳ ණයකරුවන් වෙනින් ලද අතිරේක මුදල්		273.00	273.00
පෙර ගෙවුම් හා අත්තිකාරම්	12	8,757,300.93	19,898,891.06
ඉතුරුම් ගිණුම - මහජන බැංකුව		7,030,637.47	6,291,745.46
මුදල් හා මුදල් සමාන දෑ	13	77,035,723.92	95,466,715.11
		756,213,057.58	720,032,018.80
සමස්ත වත්කම්		**1,929,546,849.20**	1,823,642,260.28
අරමුදල් හා වගකීම්			
දායකත්වයන්			
දායක ප්‍රාග්ධනය		5,000,000.00	5,000,000.00
		5,000,000.00	5,000,000.00
බාහිර දායකත්ව	14		
මහා භාණ්ඩාගාරය		300,828,384.15	320,316,114.38
ලෝක සෞඛ්‍ය සංවිධානය		3,994,341.00	3,994,341.00
ආයුර්වේද අත්හදා බැලීමේ ආයතනය		761,274.00	761,274.00
		305,583,999.15	325,071,729.38
සංචිත	15		
ප්‍රාග්ධන සංචිත		1,923,741.00	1,923,741.00
ප්‍රතිඇගයුම්කරණ සංචිත		825,362,289.37	766,658,227.32
රන් තොග ප්‍රති ඇගයුම්කරණ සංචිතය		3,720,050.00	13,558,612.40
විදේශ විනිමය ගැලපුම් සංචිත		19,523.00	19,523.00
රඳවාගත් ඉපැයුම්		485,984,039.27	494,483,507.73
		1,317,009,642.64	1,276,643,611.45
		1,627,593,641.79	1,606,715,340.83
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම	16	16,773,300.35	8,474,657.32
බැංකු ණය - මහජන බැංකුව		16,333,333.77	20,333,333.73
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්	17	35,461,706.26	33,286,336.14
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදල		5,701,000.00	-
		74,269,340.38	62,094,327.19
ජංගම වගකීම්			
වෙළඳ ණයකරුවෝ		149,673,262.32	77,872,027.87
වෙළඳ ණයගැතියන් වෙනින් ලද අතිරේක මුදල්		499,286.02	494,867.31
උපචිත වියදම්	18	32,035,760.66	35,908,373.20
සෙසු ජංගම වගකීම්	19	18,564,247.28	14,192,406.54
බදුකරණය සඳහා ප්‍රතිපාදනය	20	7,911,310.79	7,364,917.38
ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල		15,000,000.00	15,000,000.00
බැංකු ණය - මහජන බැංකුව		3,999,999.96	3,999,999.96
		227,683,867.03	154,832,592.26
සමස්ත අරමුදල් හා බැරකම්		**1,929,546,849.20**	1,823,642,260.28

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම දරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අත්සන් කරන ලදී: 14452 නිරණ අංකයට අනුව 2023.07.12 දින ගිණුම් අනුමත කරන ලදී.

සභාපති	කළමනාකාර අධ්‍යක්ෂ	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	සාමාන්‍යාධිකාරී	සහකාර සාමාන්‍යාධිකාරී(මූල්‍ය)

දිනය 2023/07/12

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2022 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	**2022**	2021
		රු. ශත.	රු. ශත.
අලෙවිය	**23**	**935,892,860.08**	800,223,255.84
අඩු කළා: අලෙවි පිරිවැය	**24**	676,650,181.24	588,951,069.13
දළ ලාභය / (අලාභය)		**259,242,678.84**	211,272,186.71
සෙසු ආදායම් / (වියදම්)	**25**	13,869,792.63	5,116,087.34
		273,112,471.47	216,388,274.05
අඩුකළා: පරිපාලන හා ආයතනික වියදම්	**26**	184,922,843.46	152,912,173.92
අලෙවි හා බෙදාහැරීම් වියදම්	**27**	103,527,767.63	83,628,233.97
		288,450,611.09	236,540,407.89
මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය		**(15,338,139.62)**	(20,152,133.84)
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම)	**28**	16,346,859.68	2,423,183.51
බදුකරණයට පෙර ශුද්ධ අතිරික්තය		**1,008,720.06**	(17,728,950.33)
අඩුකළා: ආදායම් බදු වියදම්	**29**	**589,810.41**	-
බදුකරණයෙන් පසු ශුද්ධ අතිරික්තය		**418,909.65**	(17,728,950.33)
අඩුකළා: සැලකුණු ලාභාංශ බදු		-	-
		418,909.65	(17,728,950.33)
සෙසු විස්තීර්ණ ආදායම			
වත්කම් ප්‍රති ඇගයුම්කරණ ලාභ / (අලාභ)		58,704,062.05	-
වසර සඳහා වන සමස්ත සෙසු විස්තීර්ණ ආදායම		**58,704,062.05**	-
වසර සඳහා වන සමස්ත විස්තීර්ණ ආදායම		**59,122,971.69**	(17,728,950.33)

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනිවාර්ය කොටසක් වෙයි.
වරහන් තුළ දී ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2022 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය

	සටහන	2022	2021
අමුද්‍රව්‍ය පරිභෝජනය		**රු. ශත.**	රු. ශත.
ආරම්භක තොගය		85,399,305.29	70,360,761.00
එකතු කළා:මිලදී ගැනීම්		412,494,594.46	364,238,376.14
		497,893,899.75	434,599,137.14
අඩු කළා: අවසන් තොගය		96,125,057.87	85,399,305.29
අමුද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**401,768,841.88**	349,199,831.85
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය			
ආරම්භක තොගය		16,364,357.22	21,824,951.00
එකතු කළා: මිලදී ගැනීම්		72,563,300.03	44,053,135.85
		88,927,657.25	65,878,086.85
අඩු කළා: අවසන් තොගය		39,356,268.37	16,364,357.22
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**49,571,388.88**	49,513,729.63
දැවිතෙල් පරිභෝජන පිරිවැය			
ආරම්භක තොගය		1,059,750.00	607,200.00
එකතු කළා: මිලදී ගැනීම්		66,049,521.65	26,482,622.00
		67,109,271.65	27,089,822.00
අඩු කළා: අවසන් තොගය		2,568,000.00	1,059,750.00
ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජන පිරිවැය		**64,541,271.65**	26,030,072.00
සෘජු ශ්‍රම වියදම්	**21**	119,866,375.88	116,991,363.27
ප්‍රාථමික පිරිවැය		**635,747,878.29**	541,734,996.75
කර්මාන්තශාලා පොදුකාර්ය පිරිවැය			
වක්‍ර වියදම්	**22**	89,168,173.40	90,841,978.55
එකතු කළා: ආරම්භක සම්පූර්ණ නොකළ		21,926,628.00	15,108,788.00
අඩුකළා: අවසාන සම්පූර්ණ නොකළ		20,691,648.00	21,926,628.00
		90,403,153.40	84,024,138.55
වසරේ සමස්ත නිෂ්පාදන පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළට ඉදිරියට ගෙනයන ලදී		**726,151,031.69**	625,759,135.30

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2022 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා වූ

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

	2022	2021
	රු. ශත.	රු. ශත.
මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
බදුකරණයට පෙර ශුද්ධ ලාභය	1,008,720.06	(17,728,950.33)
ගැලපීම්		
ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම්	8,298,643.03	(6,451,953.50)
දේපළ, පිරියත හා උපකරණ ක්ෂය වීම්	57,091,291.30	54,438,222.14
ක්‍රමක්ෂය භාණ්ඩාගාර අරමුදල් (ක්ෂයවීම්)	(19,487,730.23)	(20,702,438.47)
සේවක ප්‍රතිලාභ ගැලපීම්	4,522,772.50	6,608,505.00
පෙර වසරේ ගැලපීම්	(8,918,378.11)	(1,034,492.18)
ක්‍රමක්ෂය - අනුරාධපුර ගොඩනැගිලි ගිවිසුම	-	497,321.24
ගෙවිය යුතුව පවත්නා රඳවා ගැනීමේ බදු	(43,417.00)	-
	42,471,901.55	15,626,213.90
කාරක ප්‍රාග්ධනය වෙනස් කිරීමට පෙර ලාභය		
තොග ඉහළ/පහළ යාම්	(87,775,737.51)	(51,918,850.85)
කාර්ය මණ්ඩල ණය ඉහළ / පහළ යාම්	(5,472,243.58)	1,665,927.64
පෙර ගෙවීම් හා අත්තිකාරම් ඉහළ/පහළ යාම්	11,141,590.13	(2,540,487.12)
විවිධ තැන්පතු ඉහළ/පහළ යාම්	(74,025.00)	(354,000.00)
වෙළඳ ණයකරුවන් ආශ්‍රිත ඉහළ/පහළ යාම්	(35,938,144.96)	4,299,974.02
වෙළඳ ණය හිමියන් සම්බන්ධ ඉහළ/පහළ යාම්	71,801,234.45	24,238,864.45
වෙනත් ජංගම බැරකම් සම්බන්ධ ඉහළ/පහළ යාම්	4,371,840.74	2,273,721.74
උපචිත වැය ඉහළ/පහළ යාම්	(3,872,612.54)	12,088,923.29
වෙළඳ ණය හිමියන් වෙතින් ලත් අතිරේක මුදල් ඉහළ/පහළ යාම්		4,765.00
වෙළඳ ණයකරුවන් වෙතින් ලත් අතිරේක මුදල් ඉහළ/පහළ යාම්	4,418.71	53,757.77
අලෙවි නියෝජිත රක්ෂණ අරමුදලේ ඉහළ / පහළ යාම්	5,701,000.00	-
	2,359,221.99	5,438,809.84
අඩුකළා: ගෙවූ පාරිතෝෂික	(2,347,402.38)	(7,869,670.00)
ගෙවූ බදු මුදල්	-	(1,958,583.00)
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**11,819.61**	(4,389,443.16)
අයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්		
දේපළ, පිරියත හා උපකරණ (PPE) අත්පත් කරගැනීම	(63,204,487.05)	(40,867,359.22)
සිදු කරමින් පවත්නා කටයුතුවලට අදාළ ආයෝජනය	(4,292,110.86)	1,808,795.35
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	65,728,360.50	(13,347,996.06)
ආන්තික ගිණුමේ ආයෝජනය	(11,935,681.42)	1,809,960.11
ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(13,703,918.83)**	(50,596,599.82)
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය		
මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල්	-	23,500,000.00
ප්‍රදාන / (ආපසු ගෙවීම්) බැංකු ණය	(3,999,999.96)	(3,666,666.63)
මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(3,999,999.96)**	19,833,333.37
මුදල් හා මුදල් සමාන දෑ සම්බන්ධ ශුද්ධ ඉහළ / පහළ යාම	(17,692,099.18)	(35,152,709.61)
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	101,758,460.57	136,911,170.18
වසර අවසන මුදල් හා මුදල් සමාන දෑ	**84,066,361.39**	101,758,460.57

	2022	2021
	රු. ශත.	රු. ශත.
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97100-182315453	4,739,076.16	12,170,097.37
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97100-272315453	10,674,353.23	16,304,545.89
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97100-362315453	40,774,958.58	-
මහජන බැංකුව - ගංගොඩවිල - ගි.අ. 97200-432315453	12,925,760.51	6,800,903.23
මහජන බැංකුව - ගංගොඩවිල - ඉතුරුම් ගිණුම	7,030,637.47	6,291,745.46
ලංකා බැංකුව - ආයතනික ශාඛාව - ගි.අ.00001209	5,721,575.44	59,991,168.62
ලංකා බැංකුව - ආයතනික ශාඛාව - ගි.අ.87653784	2,200,000.00	200,000.00
	84,066,361.39	101,758,460.57

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

2022 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් වසර සඳහා

සම කොටස් විචලන ප්‍රකාශනය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රාජ්‍ය භාණ්ඩාගාරය	ලෝ.සෞ.සං.	අමාත්‍යාංශ හා රජයේ ආයතන	ප්‍රාග්ධන සංචිත	ප්‍රති-ඇගයුම්කරණ සංචිත	රන් තොග ප්‍රති-ඇගයුම්කරණ සංචිතය	විදේශ මුදල් වර්ධන සංචිතය	රඳවාගත් ඉපැයීම්	එකතුව
	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.	රු. ශත.
2022.01.01 දිනට ශේෂය	**5,000,000.00**	**320,316,114.38**	**3,994,341.00**	**761,274.00**	**1,923,741.00**	**766,658,227.32**	**13,558,612.40**	**19,523.00**	**497,712,121.83**	**1,609,943,954.93**
පෙර වසර ගැලපුම්	-	-	-	-	-	-	-	-	(12,146,992.21)	**(12,146,992.21)**
						-	-		-	-
<u>වසර තුළ ගැලපුම්</u>										
වසර සඳහා ලද අරමුදල්	-	-	-	-	-	-	-	-	-	-
භාණ්ඩාගාර අරමුදල් ක්‍රමක්ෂය- **(සටහන 14.1)**	-	(19,487,730.23)	-	-	-	-	-	-	-	**(19,487,730.23)**
මෝටර් වාහන ප්‍රති ඇගයුම්කරණ සංඛ්‍යාව	-	-	-	-	-	58,704,062.05	-	-	-	**58,704,062.05**
රන් තොග ප්‍රති ඇගයුම්කරණ සංඛ්‍යාව	-	-	-	-	-	-	(9,838,562.40)	-	-	**(9,838,562.40)**
වසර සඳහා වූ සමස්ත විස්තීර්ණ ආදායම	-	-	-	-	-	-	-	-	418,909.65	**418,909.65**
2022.12.31 දිනට ශේෂය	**5,000,000.00**	**300,828,384.15**	**3,994,341.00**	**761,274.00**	**1,923,741.00**	**825,362,289.37**	**3,720,050.00**	**19,523.00**	**485,984,039.27**	**1,627,593,641.79**

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ දී ඇති සංඛ්‍යා තුළින් අඩු කිරීම් දක්වයි.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් - 2022

1. **සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1969 මැයි මස 11 දිනැති අංක 14853/1 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1969 වසරේදී සංස්ථාපනය කරන ලදී. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම යන ස්ථානයේ පිහිටා ඇත.

ප්‍රධාන කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කටයුතු වනුයේ ආයුර්වේද බෙහෙත් හා ඔසු නිෂ්පාදනය කොට ඒවා රජයේ රෝහල්, ආයුර්වේද වෛද්‍යවරුන් හා පුද්ගලික අංශය වෙත අලෙවි කිරීමයි.

2022 දෙසැම්බර් මස 31වන දිනට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ මුළු කාර්ය මණ්ඩලය 356ක් විය (2021-356).

2. සැකසුම් පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සම කොටස් විචලන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද සමගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ("මූල්‍ය ප්‍රකාශන") යන අන්තර්ගතයන්ගෙන් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් පනවන ලද නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS / LKAS) හා ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද මුදල් රෙගුලාසි ප්‍රකාර සකස් කොට ඇත.

2022 අප්‍රේල් මස 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය පවරන ලදී. (අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංකය 14193).

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකසා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන් තුළ උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

2.3 මූල්‍ය බැඳීම් සපුරාලන ආයතනයක් ලෙස

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව නුදුරු අනාගතය තුළ මූල්‍ය බැඳීම් සපුරාලන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීම විෂයයෙහි දක්වන සමත්කම පිළිබඳ තක්සේරුවක් සිදුකර ඇති අතර, ඔවුන් විසින් සංස්ථාවේ කටයුතු ඇවර කිරීමක් හෝ නවතාලීමක් සිදු කළ යුතු බවට පුරෝකථනය කරනු නොලබයි.

2.4 සන්සන්දනාත්මක තොරතුරු

වඩාත් හොඳින් ඉදිරිපත් කරනු පිණිස හා පවත්නා වර්ෂය සමගින් සන්සන්දනය කිරීමට හැකිවනු පිණිස පසුගිය වසරයන්හි මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය අදාළ තැන්හි සංශෝධනය කර ඇත.

2.5 ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යෙදවීමට හා වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ප්‍රමාණයට බලපාන්නාවූ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කිරීම විය යුතු වේ.

විනිශ්චයන් හා ඇස්තමේන්තු පවත්නා තත්ත්වයන් යටතේ සාධාරණ බවට විශ්වාස කරන්නාවූ අපේක්ෂාවන්ද ඇතුළත් ඓතිහාසික අත්දැකීම්, ප්‍රවණතාවයන් හා සෙසු සාධකයන් මත පදනම් වේ. ඒ අනුව, සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන්ගෙන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිවේ.

ඇස්තමේන්තුවල හා එයට පදනම්ගත උපකල්පනයන්ගේ වලංගුතාවය නිහවුරු කරනු වස් ඒවා මූල්‍ය බැඳීම් සපුරාලීමේ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සමාලෝචනය කෙරෙන හා බලපෑමට ලක්වන යම් මතු සමයන් තුළද ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ ප්‍රතිශෝධනයන් හඳුනාගනු ලබයි. මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගෙන ඇති සංඛ්‍යාවනට වැඩියෙන්ම බලපෑමක් ඇති කරන්නාවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම සම්බන්ධ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් තුළ ඇතුළත් කර ඇත:

2.6 විදේශ මුදල් ගනුදෙනු

(අ) කාර්ය හා ඉදිරිපත් කිරීමේ මුදල්

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශනයන් තුළ ඇතුළත් කර ඇති අයිතමයන් එම ආයතනය ක්‍රියාත්මකවන මූලික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය (කාර්ය මුදල්) යොදාගනිමින් මිනුම්ගත කෙරේ. මූල්‍ය ප්‍රකාශන සංස්ථාවේ කාර්ය හා ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් (ශ්‍රී ලං.රු.) ඉදිරිපත් කෙරේ.

(ආ) ගනුදෙනු හා ශේෂ

ගනුදෙනු සිදුවන දිනයන්හි පවත්නා විනිමය අනුපාතයන් භාවිතයෙන් විදේශ විනිමය ගනුදෙනු කාර්ය මුදල් බවට පරිවර්තනය කෙරේ.

03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදාගනු ලබන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. අන් අයුරකින් ප්‍රකාශ කොට ඇත්තේ නම් විනා මෙම ප්‍රතිපත්ති ස්ථීර ලෙස ඉදිරිපත් කරන ලද සියලු වර්ෂයනට යොදාගනු ලැබ ඇත.

3.1 වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වත්කම් සේ වර්ගීකරණය කොට ඇති වත්කම් මුදල්, බැංකු ශේෂ සංස්ථාවේ සාමාන්‍ය කටයුතු චක්‍රය තුළ හෝ වාර්තාකරණ කාලයේ සිට එක් වසරක් ඇතුළත හෝ යන දෙකෙන් කවර හෝ කලින් එළැඹෙන දිනයෙහි මුදල් බවට උපලබ්ධිගත කෙරෙනු ඇතැයි අපේක්ෂිත වත්කම් වේ. ජංගම වත්කම් හැර අන් වත්කම් වනුයේ වාර්තා කිරීමේ දිනයේ සිට එක් වසරකට වැඩි කාලයක් තුළ රඳවා තබාගැනීමට සංස්ථාව විසින් අපේක්ෂා කරන්නාවූ වත්කම් වේ.

3.1.1 දේපළ, පිරියත හා උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම

දේපළ, පිරියත හා උපකරණ තුළට ඇතුළත්වන අයිතමයක පිරිවැය එය මිලදීගත් මිල හා වත්කම එහි අපේක්ෂිත පරිහරණය සඳහා අවශ්‍ය කාර්ය මට්ටමට ගෙනඑනු පිණිස සෘජුවම යෙදෙන පිරිවැයක් වේනම් එයද වේ.

ස්වයං-ඉදිකිරීම්ගත වත්කම් පිරිවැය තුළට ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය හා වත්කම එහි අපේක්ෂිත පරිහරණය වෙනුවෙන් කාර්යගත මට්ටමට ගෙනඑනු පිණිස සෘජුවම දැරීමට සිදුවන වෙනයම් පිරිවැයක් වේනම් එයද ඇතුළත් වේ. මෙතුළට අයිතම කැබලිවලට ගලවා ඉවත් කොට ඒවා පිහිටි ස්ථානය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයද සුදුසුකම් ලත් වත්කම් මත වූ ණයට ගත් පිරිවැයද අයත් වේ.

යම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් තුළ විවිධ වූ ප්‍රයෝජනවත් ජීව කාලයන් පවත්නා විටදී, ඒවා දේපළ, පිරියත හා උපකරණවලට අදාළ වෙන් වෙන් වූ අයිතම (ප්‍රධාන සංගටක) වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.
දේපළ පිරියත හා උපකරණයන්හි පවත්නා වටිනාකම් පියවාගත නොහැකි බව සිදුවීම් හෝ වෙනස්වන තත්ත්වයන් තුළ පෙනී යන විටදී ඒවාට හානි සිදුවී ඇත්තේදැයි සමාලෝචනය කරනු ලැබේ. වත්කමක පවත්නා වටිනාකම ඇස්තමේන්තුගත පියවාගත හැකි වටිනාකමට වඩා ඉහළ අගයක් ගන්නේ නම්, එහි පවත්නා වටිනාකම වහා එහි පියවාගත හැකි වටිනාකමට ලේඛනගත කරනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් අපහරණයේදී සිදුවන ලාභය හා අලාභය අපහරණයෙන් ලද මුදල හා දේපළ, පිරියත හා උපකරණයේ අන්තර්ගත වටිනාකම අතර වෙනස ලෙස නිර්ණය කෙරෙන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ සෙසු ආදායම් යටතේ හඳුනා ගැනේ.

3.1.1.2 පසු පිරිවැය

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක කොටසක් මාරු කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලායන අතර එහි පිරිවැය විශ්වසනීය ලෙස මිනුම්ගත කළ හැක්කේය යන කරුණ බොහෝ කොටම විය හැක්කක් නම්, එම අයිතමයේ අන්තර්ගත වටිනාකම තුළ හඳුනාගැනේ.

දේපළ, පිරියත හා උපකරණයන් සේවාකරණයේ එදිනෙදා පිරිවැය ලාභ හෝ අලාභ සිදුවන විටදී හඳුනා ගැනේ.

3.1.1.3 නිල පිළිගැනීම අවලංගු කිරීම

යම් දේපළ, පිරියත හා උපකරණයක් අපහරණයේදී හෝ එය පරිහරණය තුළින් හෝ අපහරණය තුළින් මතු ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකෙරෙන විටදී එහි අන්තර්ගත වටිනාකමට අදාළ නිල පිළිගැනීම අවලංගු කරනු ලැබේ. නිල පිළිගැනීම අවලංගු කිරීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ ලාභාලාභයන්හි සෙසු ආදායම් තුළ හඳුනාගනු ලබයි.

3.1.1.4 අනුරාධපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය

අනුරාධපුර ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය පස් වසර කාල පරිච්ඡේදය තුළ වියදමක් ලෙස හඳුනා ගැනේ. (වසර 5ක කාලය සඳහා දේපළ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත මාරුකර ඇත).

3.1.1.5 නරක් වූ හා අඩමාන ණය

නරක් වූ ණය
අදාළ මුදල පියවාගත නොහැකි බවට ස්ථීර වූ පසු නරක්වූ ණය ලාභාලාභ ගිණුමේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

අඩමාන ණය
අඩමාන ණය ප්‍රතිපාදනයට අනුව පසුගිය වසර පහ ඉක්මවූ ණය ශේෂයක් ඉතිරිව පවතී.

3.1.1.6 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත පරිහරණය හෝ අලෙවිය සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ගතවන්නාවූ, සුදුසුකම් ලත් වත්කමක් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම සම්බන්ධවන ණය ගැනීමේ පිරිවැය වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනගත කෙරේ. ප්‍රාග්ධනගතකරණයට සුදුසුකම් ලබන ණය ගැනීමේ පිරිවැය ප්‍රමාණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 - ණය ගැනීමේ පිරිවැය ප්‍රකාර නිර්ණය කෙරේ.

ප්‍රාග්ධනගත නොකෙරෙන ණය ගැනීමේ පිරිවැය ඒවා සිදුවූ කාල පරිච්ඡේදය තුළ සිදුකරන ලද වියදම් සේ හඳුනාගනු ලබන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළට අය කිරීම් ලෙස ඇතුළත් කෙරේ.

3.1.1.7 ක්ෂය වීම්

ක්ෂය වීම යන්න යම් වත්කමක පිරිවැය හෝ එම පිරිවැය වෙනුවෙන් ආදේශනය කෙරෙන වෙනත් මුදලකින් එහි අවශේෂ වටිනාකම අඩු කිරීමෙන් ලැබෙන ක්ෂය කළ හැකි මුදල මත ගණනය කෙරේ. ලාභ අලාභ තුළ ක්ෂය වීම යන්න යම් දේපළ, පිරියත හා උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකින් හඳුනාගනු ලබන අතර, එසේ කරනුයේ මෙමගින් එම වත්කම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කෙරෙනු ඇතැයි අපේක්ෂිත රටාව ඉතාමත් ආසන්නයෙන් නිරූපණය වන බැවිනි.

සංස්ථාව විසින් කල්බදු කාල පරිච්ඡේදය අවසානය වනවිට එහි හිමිකාරිත්වය ලබාගනු ඇතැයි යන සාධාරණ විශ්වාසයක් පවත්නේ නම් විනා කල්බදුගත වත්කම් කල්බදු කාල පරිච්ඡේදයේ හා එහි ප්‍රයෝජනවත් ආයු කාලයේ වඩාත් කෙටි කාලයට අනුව ක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය කරනු නොලැබේ. මෙම සංස්ථාවට අදාළ කල්බදුගත වත්කම් නොමැත.

වර්තමාන හා සන්සන්දනාත්මක කාල පරිච්ඡේදයන් සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලයන් හා ක්ෂයවීම් අනුපාතයන් පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	**ප්‍රයෝජනවත් ආයු කාලය (වර්ෂ)**	**ක්ෂයවීම් අනුපාතය (%)**
ගොඩනැගිලි	වසර 20	5%
යන්ත්‍ර	වසර 06.66	15%
ජල සම්පාදන උපකරණ	වසර 06.66	15%
රසායනාගාර උපකරණ	වසර 06.66	15%
කාර්යාල උපකරණ	වසර 10	10%
මෝටර් වාහන	වසර 05	20%
මෙවලම් හා උපකරණ	වසර 03	33.33%

වත්කමක් ක්ෂයවීම එය පරිහරණය සඳහා පවත්නා කාලය තුළ ආරම්භවන අතර, වත්කම ක්ෂයවීම අවසන් වනුයේ එය විකිණීම සඳහා තැබෙන බවට වර්ගීකරණය කෙරෙන දිනය හෝ එම වත්කමෙහි නිල පිළිගැනීම අවලංගු කෙරෙන දිනය යන දෙකෙන් කලින් එළැඹෙන දිනයේදීය.

ක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලයන් හා අවශේෂ වටිනාකම් එක් එක් මූල්‍ය වර්ෂාවසානයේදී සමාලෝචනය කෙරෙන අතර සුදුසු නම් ගලපනු ලබයි.

3.1.1.8 සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

වසර තුළ සිදු කෙරුණු හා වාර්තාකරණ දිනය වනවිට සම්පූර්ණ නොවූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්වනු ලබන අතර, වසර තුළ අවසන් කරනු ලැබ පරිහරණය සඳහා තබා ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කර ඇත.

3.1.1.9 මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ යම් මූල්‍ය ලේඛනයක හරස් පාර්ශ්වකරුවෙකු සිය කොන්ත්‍රාත්මය වගකීම් සපුරාලීමට අපොහොසත් වන්නේ නම් සංස්ථාවට සිදුවන මූල්‍ය අලාභය වන අතර සංස්ථාවට ගනුදෙනුකරුවන් හා ආශ්‍රිත පාර්ශ්වකරුවන් වෙතින් ලැබිය යුතුව පවත්නා දෙයින් මූලික වශයෙන් ඉස්මතු වේ.

වෙළඳ හා සෙසු ලැබිය යුතු දේ හා ආයෝජන සම්බන්ධයෙන් සිදුවූ ඇස්තමේන්තුගත අලාභයන් නියෝජනය කරන හානි සඳහා සංස්ථාව විසින් දීමනාවක් පනවනු ලබයි.

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබා දෙමින් පියවනු ලබන සිය මූල්‍යමය වගකීම් හා සම්බන්ධ බැඳීම් සපුරාලීමේ දුෂ්කරතාවයන් පවත්නා විටදී එසේ සංස්ථාව විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවයන් වේ. ද්‍රවශීලතාවය කළමනාකරණය කරගැනීමෙහි ලා සංස්ථාවේ ප්‍රවේශය වනුයේ සංස්ථාව වෙත පිළිගත නොහැකි අලාභයන් සිදුකරගැනීමකින් හෝ එහි කීර්ති නාමයට හානි සිදුකර ගැනීමකින්ද තොරව සාමාන්‍ය හා පීඩනකාරී තත්ත්වයන් යටතේ සපුරාලීමට ඇති වගකීම් සපුරාලීමට තරම් ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් නිරන්තරයෙන්, හැකිතාක් දුරට, පවත්වාගෙන යන බවට වගබලා ගැනීමයි.

3.1.1.10 භාණ්ඩ තොග

භාණ්ඩ තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම්ගත කරනු ලැබේ. සමාගම විසින් ශුද්ධ උපලබ්ධිගත අගය උපයෝගයෙන් තොග තක්සේරු නොකරන ලදී. මක්නිසාද, සමාගම විසින් වසර තුළ වෙළඳපල වටිනාකමට අඩු වටිනාකමකට නිෂ්පාදන අලෙවි නොකරන ලද බැවිනි. භාණ්ඩ තොග පිරිවැය තුළට තොග අත්පත් කරගැනීමේදී දරන්නට සිදුවූ වියදම්, ඒවා දැනට පවත්නා ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමේදී දරන්නට සිදුවූ සෙසු වියදම් හා නිෂ්පාදන හෝ මාරු කිරීමේ පිරිවැයද ඇතුළත් වේ. සමාගම විසින් ප්‍රධාන කාර්යාලයේ අමුද්‍රව්‍ය හා නිමා භාණ්ඩ සම්බන්ධයෙන් පැමිණි අනුපිළිවෙලගත (FIFO) සූත්‍රය යොදාගන්නා ලදී. පද්ධතියේ FIFO දත්ත නොමැතිවීම හේතුකෙට නිමි භාණ්ඩ පහත සඳහන් සූත්‍රය භාවිතයෙන් තක්සේරු කරන ලදී.

(ජනවාරි 1 දින RM මිල + අප්‍රේල් 30 RM මිල +අගෝස්තු 31 RM මිල + දෙසැම්බර් 31 RM මිල)/4
සෙසු වියදම් දැනට පවත්නා අවශෝණ පිරිවැය ක්‍රමය ප්‍රකාර වේ.

3.1.1.10.1 නොමිලේ ලද තොග තක්සේරුව

කළමනාකාරිත්වයේ තීරණයකට අනුව උක්ත තොගය මෙම වසර තුළ තක්සේරු කර ඇත. ගිණුම්කරණ පිවිසුම් සටහන් පහත පරිදි යොමු කරවන ලදී

තොග	හර (DR)
අමුද්‍රව්‍යවලින් විලම්බිත ආදායම	බැර (CR)

2021 වසරට පෙර නොමිලයේ ලද භාණ්ඩ රු. 1 අගයට තක්සේරු කරන ලදී. අංක 14193 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, නොමිලයේ ලද අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලැබ ගණනය කරන ලදී. නොමිලයේ ලද අමද්‍රව්‍යයනට අදාළ ගිණුම්කරණ සටහන් මගින් ගිණුම්වලට මෙන්ම පරිශීලකයන්ගේ ආර්ථික තීරණයනටද අහිතකර බලපෑමක් එල්ල කෙරෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. ඒ හේතුකොට,අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පෙර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රතිශෝධනය කොට නොමිලයේ ලැබෙන අමුද්‍රව්‍ය රු. 1ක මිලෙහි තැබීම සඳහා අංක 14420 දරන තීරණය ගන්නා ලදී.

නොමිලයේ ලද අමුද්‍රව්‍යයන්හි වටිනාකම් පහත පරිදි වේ.

<u>අයිතමය</u>	<u>ප්‍රමාණය (කි.ග්‍රෑ.)මිල (රු.)</u>	
කංසා (W.P) –වියළි	4,816.000	41,532,721.31
අගිල් - වියළි	9,666.700	780,100.00
කොතළ හිඹුටු - වියළි	2,766.600	81,318.99

3.1.1.11වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ

සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබාගැනීමේ කොන්ත්‍රාත්මය හිමිකමක් පවත්නා විටදී පමණක් සංස්ථාව විසින් සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් ලෙස වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ හඳුනාගනු ලබයි.

වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ යනු සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ අලෙවි කරන ලද ද්‍රව්‍ය හෝ ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් ගනුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතුවන මුදල් ප්‍රමාණයන් වේ. ඒවා එක්රැස් කර ගැනීම වසරක් හෝ එයට අඩු කාලයක් තුළ සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම්, (හෝ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ සිදු කරන්නට අපේක්ෂා කරන්නේ නම්) ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම්, ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳ අංශයෙන් ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි අගයට ගණනය කෙරෙන අතර වසරකට වැඩි ලෙස ඉතිරිව පවත්නා කාල පරිච්ඡේදය සැලකිල්ලට ගැනීමෙන් පසුව වසර අවසානයේදී ඉතිරිව පවත්නා සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සිදුකරන සමාලෝචනයක් මත පදනම්ව අඩමාන ලෙස ලැබිය හැකි දේ සම්බන්ධ ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.

කොන්ත්‍රාත්මය හිමිකමේ මුල් නියමයන් ප්‍රකාර ලැබිය යුතුව පවත්නා සියලු මුදල් ප්‍රමාණයන් සංස්ථාවට රැස්කර ගැනීමට හැකි නොවනු ඇති බවට වූ විෂය මූලික සාක්ෂි පවත්නා විටදී වෙළඳමය වශයෙන් ලැබිය යුතු දේට අදාළ අලාභ හානි පිළිබඳ ප්‍රතිපාදනයක් පනවනු ලැබේ.

3.1.1.12 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ අත ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු හා කෙටි කාලීන අධි ද්‍රවශීලී ආයෝජන ලෙස අර්ථ නිරූපණය කරනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අවශ්‍යතාවය සඳහා, මුදල් හා මුදල් සමාන දේ අත ඇති මුදල්, බැංකුවන ඇති තැන්පතු හා ගෙවිය යුතුව පවත්නා බැංකු අයිරාවන්හි ශුද්ධ අගයද යන අගයන්ගෙන් සමන්විත වේ.

3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන වගකීම් යනු ඉල්ලුමට අනුව ගෙවිය යුතුවන හෝ වාර්තා කරන දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතුව පවත්නා ඒවා වේ. ජංගම නොවන වගකීම් යනු වාර්තා කිරීමේ දිනයේ සිට වසරක් ගතවූ පසු ගෙවීමට නියම වන ඒවා වේ. මෙම මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීමේදී සියලු දැනුවත් වගකීම් ගණනය කරන ලදී.

පසුගිය සිදුවීමක් හේතුකොටගෙන සංස්ථාවට විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ ධනාත්මක බැඳීමක් පවත්නා අතර එම බැඳීම පියවනු පිණිස ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි නම් ප්‍රතිපාදනයක් හඳුනාගනු ලබයි.

3.2.1 මහා භාණ්ඩාගාරයෙන් ලද දායකත්වයන්

සමුච්චිත අරමුදල ස්ථාවර වත්කම් තුළට මූල්‍යකරණය හා සම්බන්ධව රජයෙන් ලද සියලු මුදල්වල එකතුවෙන් සමන්විත වේ.

3.2.2 ණය ගැනීම්

ණය ගැනීම්, සිදුවූ ගනුදෙනු පිරිවැයෙන් ශුද්ධ වූ සාධාරණ වටිනාකමින් මූලික වශයෙන් හඳුනාගනු ලැබේ. ණය ගැනීම් ඉනික්බිති ක්‍රමක්ෂය පිරිවැයට ගෙනයනු ලැබේ; උත්පාදිත මුදල් හා මුදවා ගැනීමේ වටිනාකම යන අගයන් දෙක අතර යම් වෙනසක් පවත්නේ නම් එය ඵලදායී පොළී ක්‍රමවේදය යොදාගනිමින් ණය ගැනීම් කාල පරිච්ඡේදය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, වාර්තාකරන දිනය වනවිට කිසිදු ණය ගැනීමක් නොමැත.

3.2.3 සේවක ප්‍රතිලාභ

(අ) අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්ම

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය හා වන්දි මුදල වැනි සාධක එකක් හෝ ගණනාවක් හේතුකොට විශ්‍රාම ගැනීමේදී සේවකයෙකු වෙත ලැබෙන ප්‍රතිලාභයේ වටිනාකම අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලසුම් තුළ අර්ථ නිරූපණය කෙරේ.

සියලු සුදුසුකම් ලත් සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අවශ්‍ය කෙරෙන පරිදි සංස්ථාව විසින් අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලැස්මක් පවත්වාගෙන යනු ලබයි.

අර්ථ නිරූපිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනාගෙන ඇති වගකීම වනුයේ හඳුනා නොගත් පෙර සේවා පිරිවැය සඳහා වූ ගැලපීම්ද සහිතව වාර්තා කරන දිනයට අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීමේ පවත්නා වටිනාකමයි. අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ; සේවක ප්‍රතිලාභ තුළ නිර්දේශිත ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යොදාගනිමින් සමාගම විසින් වාර්ෂිකව ගණනය කරනු ලබයි. අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන වටිනාකම ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකය මගින් නිරූපණය කරන හා අදාළ විශ්‍රාම වගකීමේ නියමයනට සමාන කල් පිරීමේ නියමයන් පවත්නා, රජයේ බැඳුම්කරයන්හි පොළී අනුපාතය යොදාගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම්ගත කිරීම මගින් නිර්ණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් හා ආයුගණක අනුමානයන් වෙතින් ඉස්මතුවන ලාභ හා අලාභ ඒවා ඉස්මතුවන කාල පරිච්ඡේදයේ සෙසු විස්තීර්ණ ආදායම් වෙත අය කිරීම හෝ බැර කිරීම සිදුවේ.

නිශ්චිත කාල පරිච්ඡේදයක් (වේෂ්ටන කාල පරිච්ඡේදය) සඳහා සේවක මහතා සේවයේ නිරත විය යුතු බවට වන කොන්දේසියක් වෙනස් කරනු ලබන සැලසුම් තුළ ඇතුළත් කෙරේ නම් විනා, පෙර සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයන් තුළ වහා හඳුනා ගැනේ. මෙහිදී වේෂ්ටන කාල පරිච්ඡේදය මත සරල රේඛීය පදනමකින් පෙර සේවා පිරිවැය ක්‍රමක්ෂය කරනු ලැබේ.

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, වසර පහක අඛන්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසු පමණි සේවක මහතෙකු සම්බන්ධ වගකීම ඉස්මතු වනුයේ.
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් තීරණය කිරීමේදී යොදගනු ලබන ප්‍රධාන උපකල්පනයන් සටහන 13 තුළ දී ඇත.

(අ). I
විශ්‍රාමික ප්‍රතිලාභ ගණනයට අදාළ උපකල්පනය
වට්ටම් අනුපාතය 12%කි
කාර්ය මණ්ඩල පිරිවැටුම 0%කි
වැටුප් වර්ධක අනුපාතය 5%කි
විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 60කි

(ආ) අර්ථ නිරූපිත දායක සැලැස්ම - සේවක ආර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

සේවක අර්ථ සාධක අරමුදල් (EPF) හා සේවා නියුන්තිකයන්ගේ භාර අරමුදල් (EPF) දායකත්ව හිමිකම් සහිත සියලු සේවකයන් අදාළ ව්‍යවස්ථා හා නියෝග හා අනුගතව අදාළ දායකත්ව අරමුදල මගින් ආවරණය කෙරේ.
සේවකයන් ආවරණය කරන සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට අදාළ දායක මුදල් ඒවා අය කෙරෙන කාල පරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වියදම් ලෙස හඳුනා ගැනේ.

3.2.4 රජයේ ප්‍රදානයන්

ප්‍රදානයන් ලැබ සියලු අනුයුක්ත කොන්දේසිවලට අනුගතව කටයුතු කෙරෙන බවට සාධාරණ සහතිකයක් පවත්නා තැන්හි රජයේ ප්‍රදානයන් හඳුනාගනු ලැබේ. ප්‍රදානය වත්කමකට සම්බන්ධ වන විටදී, වත්කමෙහි පවත්නා වටිනාකම ලබාගැනීමේදී ප්‍රදානය අඩු කරනු ලැබේ. ප්‍රදානය වියදම් අයිතමයකට සම්බන්ධ වන විටදී, වන්දි ගෙවීම සඳහා අපේක්ෂිත පිරිවැයවලට ක්‍රමික පදනමකින් ප්‍රදානය ගැලපීම සඳහා අවශ්‍යවන කාල පරිච්ඡේදය පුරා ලද ආදායමක් සේ එය හඳුනා ගැනේ.

3.2.5 වෙළඳමය වශයෙන් ගෙවිය යුතු දේ

සංස්ථාව විසින් මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබාදීමේ කොන්ත්‍රාත්මය වගකීමක් පවත්නා විටදී පමණක් සංස්ථාව විසින් වෙළඳමය වශයෙන් ගෙවිය යුතු දේ සිය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වගකීම් ලෙස හඳුනාගනු ලබයි.
වෙළඳමය වශයෙන් ගෙවිය යුතු දේ යනු සැපයුම්කරුවන් වෙතින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී අත්පත් කරගෙන ඇති භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගෙවිය යුතුවන වගකීම් වේ. ගෙවීම් කටයුතු වසරක් හෝ එයට අඩු කාල පරිච්ඡේදයක් තුළ (හෝ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ) සිදුකළ යුතුව පවත්නේ නම්

ගෙවිය යුතු ගිණුම් ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර, එයට වැඩි කාල පරිච්ඡේදයකට අදාළ වන්නේ නම්, ඒවා ජංගම නොවන වගකීම් ලෙස ඉදිරිපත් කෙරේ.
වෙළඳමය වශයෙන් ගෙවිය යුතු දේ මූලික වශයෙන් සාධාරණ වටිනාකමට හඳුනාගනු ලැබේ.

3.2.6 ප්‍රාග්ධන බැඳීම් සහ අවිනිශ්චිතතාවයන්

අවිනිශ්චිතතාවයන් යනු අතීත සිදුවීමක් තුළින් ඉස්මතු විය හැකි වත්කම් හෝ වගකීම් වන අතර, සමාගමේ පාලනයෙන් බැහැර අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදු වන හෝ සිදු නොවන විටදී පමණක් තහවුරු කෙරෙනු ඇත.

සියලු ද්‍රව්‍යාත්මක ප්‍රාග්ධන බැඳීම් හා අවිනිශ්චිත වගකීම් සටහන 29 තුළ අනාවරණය කෙරේ.

3.3 විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් කාර්ය ක්‍රමය මගින් සාධාරණ ලෙස සමාගමේ කාර්ය සාධන මූලිකාංග ඉදිරිපත් කෙරෙන්නේය යන්න අධ්‍යක්ෂවරුන්ගේ මතය වන බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අනුගතව එවන් ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් යොදාගනු ලබයි.

3.3.1 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභය සංස්ථාව වෙත ගලායන අතර ගෙවීම් කාර්යය සිදුකරන අවස්ථාව කවරක් වුවද ආදායම විශ්වසනීය ලෙස මිනුම්ගත කළ හැක්කේය යන්න විය හැක්කක් වනතාක් දුරට ආදායම හඳුනාගනු ලැබේ. කොන්ත්‍රාත්මය වශයෙන් අර්ථ නිරූපිත ගෙවීම් පිළිබඳ යෙදුම් සැලකිල්ලට ගනිමින් හා බදු ඉවත් කරමින් ලද හෝ ලැබිය යුතුව පවත්නා සලකා බලන කාරණයට අදාළ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලබයි. ආදායම හඳුනා ගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායකද සපුරාලිය යුතුය.

(අ) **භාණ්ඩ අලෙවිය**

සාමාන්‍යයෙන් අදාළ භාණ්ඩ ලබාදීමේදී භාණ්ඩයට අදාළ වැදගත් අවදානම් හා හිමිකාරිත්ව ප්‍රතිලාභයන්ද මිලදී ගන්නා වෙත මාරු කෙරෙන අවස්ථාවේදී භාණ්ඩ අලෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගනු ලබයි.

(ආ) සේවා සැපයීම

සේවා සම්පාදනය කරන හෝ ඉටු කරනු ලබන ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ සේවා සම්පාදනයට අදාළ ආදායම් හඳුනාගනු ලබයි.

(ඇ) පොළී ආදායම

පොළී ආදායම ඵලදායී පොළී ක්‍රමය මත හඳුනාගනු ලබයි.

(ඈ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමකින් හඳුනාගනු ලබයි.

(ඉ) දේපළ, පිරියත හා උපකරණ අපහරණය

දේපළ, පිරිය හා උපකරණ අලෙවියෙන් ලද ලාභය/(අලාභය) අදාළ අලෙවිය සිදුවන හා බෙදාහැරීමේ ඇණවුම නිකුත් කරන ලද කාල පරිච්ඡේදය තුළ හඳුනාගනු ලබයි.

3.3.2 වියදම් හඳුනා ගැනීම

(අ) **ආදායම් වියදම**

දරන ලද පිරිවැය හා නිශ්චිත ආදායම් අයිතමයන් තුළින් ලබන ඉපැයීම අතර සෘජු සම්බන්ධතා පදනම මත වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබයි. ව්‍යාපාරය සිදුකරගෙන යාමේදී හා කාර්යක්ෂම

තත්ත්වයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමේදී දරන ලද සියලු වියදම් වසර සඳහා ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී ආදායමට අය කෙරී ඇත.

(ආ) **ප්‍රාග්ධන වියදම්**

එමගින් ව්‍යාපාර කටයුතු සිදු කිරීම හෝ ව්‍යාපාරයේ ධාරිතාවය වර්ධනය කිරීමේ අවශ්‍යතාවය සඳහා ස්ථීර ස්වභාවයක පවත්නා වත්කම් දෙගුණ කිරීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා කරන ලද වියදම් ප්‍රාග්ධන වියදමක් ලෙස සලකා බලා ඇත.

(ඇ) **ශුද්ධ මූල්‍ය ආදායම / වියදම්**

මූල්‍ය ආදායම තුළට ආයෝජිත අරමුදල් හා කාර්ය මණ්ඩල ණය මත ලද පොළී ආදායම හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ වූ වටිනාකමට මූල්‍ය වත්කම්හි සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් අන්තර්ගත වේ. පොළී ආදායම ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් ලාභ හෝ අලාභ තුළ සිදුවන ඒකරාශි වීමට අනුව හඳුනාගනු ලැබේ.

මූල්‍ය පිරිවැය තුළට ණයට ගැනීම් මත සිදුවන පොළී වියදම්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමේදී මූල්‍ය වත්කම්හි සාධාරණ වටිනාකමෙහි සිදුවන වෙනස්වීම්, මූල්‍ය වත්කම් මත හඳුනාගනු ලබන අලාභ පාඩු, අත්පත් කරගැනීමට සෘජුවම සම්බන්ධ නොවන ණයට ගැනීමේ පිරිවැය, සුදුසුකම් ලැබීමේ වත්කමක් ඉදිකිරීම හෝ නිෂ්පාදනය යන අංගයන් ඇතුළත්වන අතර, ඒවා ඵලදායී පොළී ක්‍රමය භාවිතයෙන් ලාභ හෝ අලාභ තුළ හඳුනාගනු ලැබේ.

(ඈ) **බදු වියදම්**

ආදායම් බදු වියදම් වත්මන් හා විලම්බිත බදුවලින් සමන්විත වේ. ආදායම් බදු වියදම සම කොටස් තුළ හඳුනාගනු ලබන විටදී සෘජුවම එහි හඳුනාගනු ලබන අයිතමයනට සම්බන්ධ වන ඉමකදී හැර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ.

වත්මන් බදු

වත්මන් හා සාපේක්ෂ කාල පරිච්ඡේදයන් සඳහා වූ වත්මන් බදු වියදම් වාර්තා කරන දිනය වනවිට පනවන ලද හෝ නිත්‍ය වශයෙන් පනවන ලද පසු කාලීන නීති මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාර ගණනය කරනු ලබන අදාළ වර්ෂය සඳහා වූ බදු අයකළ හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතුව පවත්නා හෝ ගෙවනු ලබන මුදලට අනුව මිනුම්ගත කරනු ලැබේ.

සංගටකය	**2022**
බදු අනුපාතය	24%
වත්මන් බදු වියදම්	589,810.41
බදු අයකළ හැකි ආදායම	2,457,543.39

3.4 ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

යම් මිලක් අය කරනු ලබන්නේද, නැත්තේද යන කරුණ නොසලකා එක් පාර්ශ්වයකට අනෙක් පාර්ශ්වයේ මූල්‍යමය හා මෙහෙයුම් ප්‍රතිපත්ති / තීරණ පිළිබඳ වැදගත් බලපෑමක් ඇතිකළ හැකි හෝ පාලනය කළ හැකි ගනුදෙනු සම්බන්ධයෙන් අනාවරණයන් සිදුකර ඇත.

ආශ්‍රිත ආයතන සමගින් කරනු ලබන ගනුදෙනු
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට කිසිදු ආශ්‍රිත ආයතනයක් නොමැත.

3.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය "වක්‍ර ක්‍රමය" යොදාගනිමින් සකස් කොට ඇත.

3.6 කොටසකට ඉපැයුම

සමාගම විසින් සිය සාමාන්‍ය කොටස් සඳහා කොටසකට මූලික ඉපැයීම් (EPS) ඉදිරිපත් කරනු ලබයි. අදාළ කාලය තුළ ඉතිරිව පවත්නා සාමාන්‍ය කොටස්වල බරතැබූ සාමාන්‍ය අගයෙන් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් විසින් ලබා ඇති ලාභය හෝ පාඩුව බෙදීමෙන් කොටසක මූලික ඉපැයීම් ගණනය කරනු ලබයි.

3.7 වාර්තා කරන දිනයෙන් පසු සිදුවූ සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු සිදුවූ සිදුවීම් යනු සුභදායී වේවා, අසුභදායී වේවා, වාර්තා කරන කාල පරිච්ඡේදය අවසානය හා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට බලය ලබාදෙන ලද දිනය අතර සිදුවන සිදුවීම් වේ.

